# පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු
# පඤ්ඤා උදපාදි

පූජ්‍යපාද මාන්කඩවල සුදස්සන ස්වාමීන් වහන්සේ

# පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු
# පඤ්ඤා උදපාදි

පූජ්‍යපාද මාන්කඩවල සුදස්සන ස්වාමීන් වහන්සේ විසින්

2017 අගෝස්තු 21 වැනි දින

බසවක්කුලමේ දී පවත්වන ලද ධර්ම දේශනය.

**පූජ්‍යපාද මාන්කඩවල සුදස්සන ස්වාමීන් වහන්සේ**

පළමුවන මුද්‍රණය - 2017 සැප්තැම්බර්
(පිටපත් 5,000)

**ධර්ම දානය පිණිසයි.**

**සෝදුපත් බැලීම:**
රාජකීය පණ්ඩිත, ශාස්ත්‍රපති
පූජ්‍යපාද කොත්මලේ කුමාරකස්සප හිමිපාණෝ

**සංස්කරණය:**
එච්. ඒ අමරතුංග
දිල්රුක්ෂි වීරරත්න
ලක්මි කුරුප්පු

**පිටපත් ලබා ගැනීමට:**
හෝමාගම - 011 2752352
මහනුවර - කේ. දයානන්ද මහතා - 077 7665198
මාතලේ බෝගහකොටුව විහාරය - 071 4466838
මාතර - කේ. ජී. මුණිදාස මහතා - 071 4438747 - 077 3295174

**ප්‍රකාශනය:**
කේ. ජී. මුණිදාස
33/6, අකුරැස්ස පාර, මාතර
(පිටපතක මුද්‍රිත වැය රු. 23/=)

**මුද්‍රණය:**
කොලිටි ප්‍රින්ටර්ස්
17/2 පැඟිරිවත්ත පාර, නුගේගොඩ
දු.ක: 011 4 870 333

# 2017-08-21 දින බසවක්කුලමේ දී කරන ලද ධර්ම දේශනය

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස

*පඨවිං පඨවිතො දිස්වා පඨවිස්මිං නිබ්බින්දති*
*නිබ්බින්දං විරජ්ජති; විරාගා විමුච්චති; විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හොති.*
*ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායා'ති පජානාති.*

සදා පූජනීය, වන්දනීය මහා සංඝරත්නයෙන් අවසර යි. ශ්‍රද්ධා සම්පන්න කාරුණික පින්වතුනි, මේ පින්වත් සියලු දෙනාම සූදානම් වෙන්නේ ලොව්තුරා බුදුරජාණන්වහන්සේ අප කෙරෙහි අනුකම්පාවෙන් දේශනා කළ සද්ධර්මයෙන් බිඳක් ශ්‍රවණය කරන්න යි. මුලින් ම මතක් කරනවා හැම දෙනාටම විශේෂයෙන් ම මේ දේශනාව ආරම්භයේ පටන් අවසන් වෙනකම් ම ඉතාමත් ඕනෙකමින්, සිත නොයෙක් නොයෙක් අරමුණු වලට දුවන්නට නො දී, මේ දේශනාවට ම සිත මෙහෙයවලා ඕනැකමින් ධර්මය ශ්‍රවණය කරන්න කියලා.

පින්වතුනි, මේ සද්ධර්මය අවබෝධ නො වුණු නිසා, අවබෝධ කරගන්න බැරිවුණු නිසා, අති දිර්ඝ සංසාරයක අප හැමකෙනෙක් ම ඉපදෙමින්, මැරෙමින්, මැරෙමින්, ඉපදෙමින් එනවා. ඒත් භවයෙන් වැහිලා නිසා අපට පෙනෙන්නේ නෑ. නමුත් අද දවසේ දී හරි අප බුද්ධිමත් වුණොත්, නුවණැත්ත් වුණොත්, මේ ධර්මය දැකගන්න අපට පුළුවනි. බුදුරජාණන්වහන්සේගේ කාලයේදිත් බුදුරජාණන්වහන්සේ ධර්ම දේශනාවක් කරලා අවසන් වුණහම ගොඩාක් දෙනෙක් නිවන් දැක්කා. මහරහතන්වහන්සේලා වුණත් ධර්ම දේශනා කළහම දේශනාව අවසානයේ බොහෝ දෙනෙක් නිවන් දකිනවා. නිවන කියන එක දකින්න පුළුවන් එකක්.

හැබැයි ඒක පෙනෙන්නේ - දැන් මම වටාපත මෙහෙම කරලා පෙන්නුවොත්, මේක පෙනෙන්නේ කාට ද? ඒ දිහා බලාගෙන

ඉන්න කෙනාට ද, අහක බලාගෙන ඉන්න කෙනාට ද? බලාගෙන ඉන්න කෙනාට යි. ඒ වගේ, නිවන මොන තරම් මෙන්න මේක යි කියලා පෙන්නුවත් එයා ඒක බලන්නේ නැත්නම්, ඒ කියන්නේ සිත යොමුකරලා හොඳට අහන්නේ නැත්නම්, මොකක් ද මේ කියන්නේ කියන එක අහලා බලන්නේ නැත්නම්, සිත අයාලේ යන්න ඉඩ ඇරලා, සිතට එන එන විතර්ක වලට එකතු වෙලා නොයෙක් නොයෙක් දේවල් සිත සිතා ඉන්නවා නම් වටාපත පෙන්නද්දි අහක බලාගෙන ඉන්නවා වගේ, එයාටත් පෙනෙනව ද? නෑ. වටාපත පෙන්නන කොට මේ බලන්න කියලා පෙන්නන කොට, ඒ දිහාම කෙනෙක් බලනවා වගේ මේ දේශනාව කරන කොට සිත විසිරෙන්න නො දී බොහොම උවමනාවෙන් මේ මොකක් ද කියන්න හදන්නේ කියලා බලනවා නම් කෙනෙක්, ඒ නුවණක් තියන හැම කෙනෙකුට ම නිවන කියන එක දකින්න පුළුවන් එකක්. 'මෙන්න මේකට නේ ද මේ නිවන් දකිනවා කියන්නේ' කියලා. ඒ නිවන් දැකපු හැම කෙනෙක් ම මේ සංසාර දුක අවසන් කරගන්නවා ම යි.

කෙනෙකුට හොඳට මේ කියන දේ දිහා බලාගෙන හිටියොත් හොඳට ම නො තේරුනත්, 'ඇත්තට ම මේක තමයි නිවන නේ ද එහෙනම්' කියලා විශ්වාසයක් හෝ තියනවා නම් පෙන්නන කොට, ඒ විශ්වාසයට, ඒ ශ්‍රද්ධාවට කියනවා **ශ්‍රද්ධානුසාරී** කියලා. ඇත්තට ම නිවන කියන්නේ මෙහෙම ධර්මතාවයක් නේ ද කියලා කෙනෙකුට ධර්මතාවය පෙනෙයි නම්, එයාට කියනවා යටත් පිරිසෙයින් **ධම්මානුසාරී** කියලා. ඒ දෙන්නත් අනුමානයෙන් නිවන කියන්නේ මෙන්න මේකයි කියලා ඇදහීම් මාත්‍රයක් තියෙයි, ධර්මතා මාත්‍රයක් තියෙයි. ඒ පුද්ගලයින් දෙදෙනාට කියනවා **ඨිතකප්පි** කියලා. ඨිතකප්පි කියලා කියන්නේ මොකක් ද? මේ මුළු දසදහසක් සක්වල ම ගිනිගෙන විනාශවෙන්න කල්ප විනාශයක් තිබුනේ නමුදු, අර ධර්මතා දෙක දැකපු දෙන්නා සෝවාන් ඵලයට පත්වෙන තාක් මේ ලෝකයවත්, කල්පයවත් විනාශ වෙන්නේ නෑ. එක පුද්ගලයෙක් නිසා. එතකොට බලන්න මේ ධර්මය මොන තරම් වටිනවා ඇද්ද කියන එක.

ඒ නිසා මේ කතා කරන බණ ටික අපට තේරුනොත්, ඇත්තට ම අප ලබාපු මනුස්ස ජීවිතය හිස් නෑ. අප ලබාපු මනුස්ස ජීවිතයෙන් ප්‍රයෝජනයක් ගත්තා. ඒ වගේ ම අපට අම්මා, තාත්තා, දුව, පුතා, සහෝදරයා, සහෝදරී, ඥාති හිතෛශීන් වෙච්ච ඒ අයගෙත් ඇස් දෙක පාදලා දෙන්න අපට පුළුවනි. ඒ නිසා මේ අවස්ථාවේ දී මම උත්සාහවත් වෙනවා 'නිවන කියලා කියන්නේ මෙන්න මේක' යි කියන එක බුදුරජාණන්වහන්සේගේ පඨිවිධයට අනුව, පැහැදිලි කරලා පෙන්නන්න, කියලා දෙන්න. ඒක තේරුම්ගන්න පුළුවන්, ඒක දකින්න පුළුවන් නුවණක් තියන ඕනෙම කෙනෙකුට හොඳින් අහගෙන හිටියොත්. මහා ගැඹුරක් නොවේ, තීක්ෂණ යි. හරිම සියුම්. මේ ධර්මය සියුම්. නමුත් මේක ඕනෙම නුවණක් තියන කෙනෙකුට බැරි නෑ. වයස අවුරුදු හතේ අයත් බුදුරජාණන්වහන්සේගේ කාලයේ චතුරාර්‍ය්‍ය සත්‍යය අවබෝධ කරගත්තා. අවුරුදු එකසියවිසි වයස් ගිහිල්ලා පැවිදි වෙච්ච අයත් චතුරාර්‍ය්‍ය සත්‍යය අවබෝධ කරගත්තා. මේ කාරණාව තේරුම්ගන්න එක නුවණක් තියන කෙනාට ඒ තරම් අපහසු නෑ, පහසු යි. ඊගාවට මහා වැඩකුත් නෑ. නිවන් දකින්න සුළු කමටහනකින් පුළුවන්. හැබැයි ඒකට ධෛර්‍ය්‍යයක් තියෙන්න වෙනවා. වීර්‍ය්‍යයක් තියෙන්න වෙනවා. ඒක දෙවනු කාරණාවක්. නමුත් ඉස්සල්ලා මේ කියන දේ, පෙන්නන දේ තේරෙනවා ද කියලා බලන්න කෝ, මේකත් එක්තරා විදියේ භාෂාවක්, ආර්ය භාෂාව. මේ භාෂාව තේරුම්ගන්න පුළුවන් වෙයි ද කියන එක හොඳට බලන්න.

බුදුරජාණන්වහන්සේ දේශනා කරනවා *'පඨවිං පඨවිතො දිස්වා පඨවිස්මිං නිබ්බින්දති, නිබ්බින්දං විරජ්ජති; විරාගා විමුච්චති; විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හොති. ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායා'ති පජානාති'* - ඔන්න නිවනේ පඨිවිධය. පඨවිය පඨවිය හැටියට යම්කිසි කෙනෙක් දක්කොත්, පඨවියේ කළකිරෙනවා. පඨවි ධාතුවේ කළකිරෙනවා. පොඩි අයත් ඉන්න නිසා මම මේවා ඔක්කොම පැහැදිලි කරලා දෙන්නම්. කළකිරුනහම තමන් ම කළකිරෙන නිසා තමන් ඒ පඨවි ධාතුවේ ඇලෙන්නේ නෑ. ඇලෙන්නේ නැති

නිසා තමන් පඨවි ධාතුවෙන් මිදෙනවා. ***'නිබ්බින්දං විරජ්ජති; විරාගා විමුච්චති'*** පඨවි ධාතුවෙන් තමන් මිදෙනවා. තමන් එක්ක පඨවි ධාතුව, පඨවි ධාතුව එක්ක තමන් නෑ, මිදෙනවා. මිදුනහම ***'විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හොති'*** මිදුනහම 'මිදුනා' කියන නුවණක් එනවා. කොහොම ද නුවණ? ***'ඛීණා ජාති'*** මගේ ඉපදීම ඉවරයි, ඉපදීම නැති කළා. ***'වුසිතං බ්‍රහ්මචරියං'*** යමක් සඳහා සිල් රැක්කා නම්, සමාධි වැඩුවා නම්, භාවනා කළා නම් ඒ බ්‍රහ්මචරියාව දැන් මම පුරලා අවසාන යි. ***'කතං කරණීයං'*** කළ යුත්තක් තිබුනා නම් ඒක මම කරලා ඉවරයි. ***'නාපරං ඉත්ථත්තායාති'*** 'මට මත්තේ කළ යුත්තක් නෑ' කියන ප්‍රත්‍යවේක්ෂා ඤාණය තමන් කෙරෙහි ම උපදිනවා. මිදුනහම මිදුනත් එක්ක ම නිවනේ නුවණ උපදිනවා.

එතකොට අපි ඉස්සෙල්ලා පොඩ්ඩක් බලමු. නිවන හඳුන්වන නමක් තියනවා. අපි සාමාන්‍යයෙන් කියන්නේ මොකක් ද? 'අජරාමර නිවන' කියලා නේ ද? 'අජර' කියන වචනයේ තේරුම මොකක් ද? ජරාවක් නෑ කියන එක යි. ජරාව කියලා කියන්නේ පාළියෙන්, අපේ භාෂාවෙන් ගත්තොත් මහලු බව, ඇස් පෙනෙන්නේ නෑ, කන් ඇහෙන්නේ නෑ, අතපය වලංගු නෑ. මේ වගේ ශරීරය දිරන ස්වභාවයට පත්වෙන එකට කියනවා ජරාව කියලා. 'අජරයි' කියලා කියන්නේ ජරාවක් නෑ. 'අමර' කියලා කියන්නේ මරණයක් නෑ. මහලු බවක්, මරණයක් නැති, 'අජරාමර නිවනක්'. කායික මානසික සෝක, පරිදේව, දුක්ඛ, දෙමනස්ස, උපායාස කියන සෝක කිරීමක් නෑ, නම කිය කියා, ගුණ කිය කියා අඬන බවට තමයි පරිදේවය කියන්නේ. ඒ සිතේ පරිදේවයක් නෑ. දුකක් නෑ, දෙම්නසක් නෑ, වෙහෙසක් නෑ, ***සීතිභූතොස්මි නිබ්බුතො***, නිවුනේ වෙමි, සිසිල් වූයේ වෙමි කියලා කියනවා.

ඒ ජරාමරණ නැති අජරාමර බව ලැබෙන්න නම් ලැබෙන්න වෙනවා මොකක් ද? උපදින හැමදෙයක් ම, ඇතිවෙන හැමදෙයක් ම ජරාමරණයට පත්වෙනවා නේ ද? ඉපදෙන හැමකෙනෙක් ම ජරාමරණයන්ගෙන් යුක්තයි නේ ද? අජරාමර වෙන්න නම් වෙනවා මොකක් ද? නූපදින්න වෙනවා. ***ජාති නිරොධො ජරාමරණ සොක පරිදෙව දුක්ඛ දෙමනස්ස උපායාසා නිරුජ්ඣන්ති.*** ජරාමරණ

සෝක පරිදේවයන්ගෙන් මිදෙන්න නම්, ඒවා නිරුද්ධ වෙන්න නම්, නිරුද්ධ වෙන්න වෙනවා මොකක් ද? ජාතිය, නැත්නම් ඉපදීම. ඉපදීම නැති කරලා අජරාමර වෙන එකටයි, නිවන කියලා කියන්නේ.

මෙතන තියන සුවිශේෂිකම මේ ශාසනයේ '*පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි, ඤාණං උදපාදි, පඤ්ඤා උදපාදි, විජ්ජා උදපාදි, ආලොකො උදපාදි*[1] බුදුරජාණන්වහන්සේට මේ දුක යි කියලා පෙර නො ඇසූ විරූ ධර්මයක් කෙරෙහි නුවණ පහළ වුණා. එතකොට මේ ජාති නිරෝධය පිළිබඳව ලෝකයේ කවදාවත් කිසිම කෙනෙක්ගෙන් අහලා නැති පිළිවිඩයක් තමයි බුදුරජාණන්වහන්සේට අවබෝධ වුණේ, අවබෝධ කරගත්තේ. ඒකයි මේ චතුරාර්‍ය සත්‍යය, නැත්නම් මේ නිවන මේ ශාසනයේ ම විතරයි තියෙන්නේ කියලා කියන්නේ. ජාතිය නිරෝධ කරලා, ජරාමරණ නිරෝධ කරන පිළිවිඩය තියෙන්නේ මේ බුද්ධ ශාසනයේ මිසක වෙන තැනක නො වෙයි. එතකොට මේ ජාතිය කියන එක, ඉපදීම කියන, එක බුදුරජාණන්වහන්සේ ඉතා සුවිශේෂී ක්‍රම උපායකින්, ගැඹුරු දර්ශනයකින් පෙන්නනවා. අපට අවශ්‍ය යම්තාක් අජාරාමර බවක් නම් ඒ අජරාමර බව ලැබෙන පිළිවිඩය පෙන්නනවා. ඒ නිසා මෙන්න මේ ටික හොඳට අහගන්න ඕනේ.

උපමාවක් කළොත්, අපි උදැල්ලකුත් අරගෙන හුඹහක් ගාවට ගිහිල්ලා හුඹහ කොටලා මැටි ටිකක් ගන්නවා. කාටත් මැටි කියන ටික පැහැදිලියි නේ ද? ඔන්න ඔය මැටි වලට තමයි පාළියෙන් 'පඨවි' කියලා කියන්නේ. තද ගතිය, පස්, පොළව කියලා කියන්නේ අපි. සිංහලෙන් අපි පොළව කියන එක වගේ තමයි 'පඨවි' කියන්නේ 'තද ස්වභාවය'. ඒක වැඩි වශයෙන් පොළවේ තියන නිසා තමයි පඨවිය කියලා අපට පොළව පෙන්නන්නේ. ඔන්න හුඹහක් ගාවට ගිහිල්ලා අපි හුඹහ කොටලා පස් ටිකක් ගන්නවා. ඒ පස් වලට තමයි පඨවි කියලා කියන්නේ පාළියෙන්, සිංහලෙන් අපි පස් කියලා කියමු කෝ තේරුම් ගන්න. පඨවිය තව

[1] ධම්මචක්කප්පවත්තන සූත්‍රය, සංයුත්ත නිකාය, මහාවග්ගපාළි, සච්චසංයුත්තං

ටිකක් ගැඹුරට විස්තර වෙනවා නමුත් පස් කියන මට්ටමම දැනට සිහිකරගන්න කෝ.

ඔය හුඹහක තියන මැටි සත්ත්වයෙක් කියලා ඔයගොල්ලන්ට හිතෙනව ද? පුද්ගලයෙක් කියලා හිතෙනව ද? ආත්මයක් තියනවා කියලා හිතෙනව ද? නෑ නේ ද? හොඳට බලන්න. ඔය මැටි ටිකට වතුර ටිකකුත් දාලා අනලා එක එක හැඩවලට අපි රූප ටිකක් හදලා තිබ්බොත්, දැන් මේ රූපවල හැඩය අපට අල්ලන්න පුළුවන් ද මැටි ටික අහුවෙන්නේ නැතුව? මම කියන එක තේරෙනවා ද? මැටි ටික කොටලා අනලා මැටි ටිකෙන් අපි එක එක හැඩයට රූප ටිකක් හදනවා. දැන් මේ අවකාශ ධාතුව තුළ මැටි ටික රාශි වෙච්ච හැඩය නේ ද තියෙන්නේ? ඒ හැඩය විතරක් අපට අල්ලන්න පුළුවන් ද මැටි අහුවෙන්නේ නැතුව? බෑ. මැටි වල හැඩය නේ ද? ඔන්න ඔය එබඳු මැටි රූපයක්, හැඩයක් අපේ ඇස් ඉදිරිපිටට ආවා කියන්න කෝ. ආවහම ඔන්න මැටි රූපයක හැඩය පෙනෙන්නේ. අපට නේ පෙනෙන්නේ. පෙනෙන දෙයට අපි හිතනවා අශ්වයෙක්ගේ රූපයක් කියලා. කව්ද හිතන්නේ දැන් පෙනෙන දෙයට? අපි යි. අශ්වයෙක්ගේ රූපයක් කියලා හිතනවා. අපම හිතලා අශ්වයෙක්ගේ රූපය කියන අදහසින් අර මැටි ටික දිහා බැලුවහම, දැන් අපට ඒ මැටි ටික පෙනෙන්නේ කොහොම ද? අශ්ව රූපයක් හැටියට නේ ද? අශ්වයෙක්ගේ හැඩයක් හැටියට.

ඊට පස්සේ ඔය මැටි ටිකේ තියන තව හැඩයක් අරගෙන ඒ හැඩයට අපි හිතනවා මේක ගවයෙක් කියලා, හිතලා ඒ හැඩය දිහා බලනවා ගවයෙක්ගේ රූපයක් කියලා. දැන් ඒ හැඩය පෙනෙන්නේ කොහොම ද? ගවයෙක්ගේ රූපයක් කියලා. ඊට පස්සේ තියන හැඩයක් අරගෙන ඒ හැඩයට මේ ස්ත්‍රී රූපයක් කියලා හිතනවා. හිතලා ඒ රූපය දිහා අපි බලනවා මේ ස්ත්‍රී රූපයක් කියලා. දැන් ඒ රූපය මොන විදිහ ද? ස්ත්‍රී රූපයක්. ඊ ගාවට අවකාශ ධාතුවේ රාශි වෙලා තියන මැටි ටික පෙනෙන කොට ඒ පෙනෙන හැඩයට අපි හිතනවා පුරුෂයෙක් කියලා. හිතලා ඒ පුරුෂයා කියන අදහසින් අර මැටි රූපය දිහා බලනවා. දැන් ඒ රූපය පෙනෙන්නේ කොහොම ද? පුරුෂ රූපයක් හැටියට යි. දැන් අපට බාහිරින් අශ්ව

රූප, ගව රූප, ස්ත්‍රී රූප, මනුස්ස රූප හම්බවෙනවා නේ ද? හම්බවෙනවා.

හොඳට බලන්න මෙතන යථාර්ථය, මම අශ්වයෙක් කියලා බැලුවා කියලා මැටි ටික වෙනස් වෙනව ද? මම ගවයෙක් කියලා බැලුවා කියලා, ස්ත්‍රියක් කියලා බැලුවා කියලා, පුරුෂයෙක් කියලා බැලුවා කියලා මැටි ටික වෙනස් වෙනවා ද? නෑ. මැටි මැටි ම යි. නමුත් මැටි ටික ස්ත්‍රී රූපයක් කියලා, පුරුෂ රූපයක් කියලා, අශ්ව රූපයක්, ගව රූපයක් කියලා බලන්නේ කව්ද මැටි ටික දිහා? අපි යි. බාහිර හුළඟකින් ලොකු ගලක් පෙරළලා නැත්නම් පොලු කෑල්ලකින් අර මැටි ටික පොඩිකරගෙන ගියොත්, 'අපරාදේ අර ස්ත්‍රී රූපය කැඩුණා, අර පුරුෂ රූපය කැඩුණා, අර අශ්ව රූපය කැඩුණා, අර ගව රූපය කැඩුණා' කියලා අපට පෙනෙයි, අපට තේරෙයි නේ ද? අපට එහෙම තේරෙද්දි දැන් පින්වතුන්ට පෙනෙනවා ද එක දෙයක්, පුරුෂයා කියලා, ස්ත්‍රිය කියලා, අශ්වයා කියලා, ගවයා කියලා අපි ඒ දිහා බැලුවට, අපේ දර්ශනයට ඔබ්බෙන් ඒකත්වයක් තියනවා ඔය කිසිම දෙයකට අයිති නැති යථාර්ථයක්, පස් ටික, පඨවිය පඨවිය ම යි නේ ද? හරි.

ඒ උපමාව වගේ, පින්වතුන් අම්මා, තාත්තා, දුව, පුතා, අයියා, අක්කා, නැන්දා, මාමා, උපාසක මහත්තයා, උපාසක අම්මා, හාමුදුරුවෝ කියලා යම් තාක් නෑදෑකම් පවත්වන රූපයක් ගන්න, හැම රූපයක් ම බත්, පාන්, කව්පි, මුං ඇට කියන්නේ සත්තුයින්, පුද්ගලයින් ද? බත් ටිකක් ගත්තොත්, පාන් කෑල්ලක් ගත්තොත්, කව්පි ඇටයක් ගත්තොත්, ආහාර. එබඳු වූ ආහාරයකින් ම නේ ද හැදෙන්නේ? හරි.

ඔය ඕනෙම රූපයක් අපි විමර්ශනය කරමු. අපට දරුවා කියලා හිතෙන රූපයක් ගන්න, දැන් හිතේ අදහස පැත්තකින් තියන්න. මේ රූපයේ ස්වභාවය ගන්න. ඔය කියන නෑදෑකම් වලින් ඇසුරු කරන හැම රූපයක් ම කෙස්, ලොම්, නිය, දත්, හම කියන මේ වගේ කොටස් ටිකෙන් නේ ද හැදිලා තියෙන්නේ? කෙස් ටික සම්පූර්ණ කපලා බිමට දැම්මොත් 'කෙස්' කියලා පෙනෙයි මිසක පුද්ගලයෙක්

පෙනෙනව ද? නෑ. ඒ කෙස් අර හුඹහ කොටලා අපි මැටි ටික ගත්තා නේ. ඒ මැටි වල තියන තද ගතිය, පඨවි ගතියම ම යි කෙස් කියන එකේ තියෙන්නෙත්. අර හුඹස් මැටි ටික යි, කෙස් කියන ටික යි සමානම ම යි. හුඹස් මැටි ටික කෙනෙක් නො වෙයි ම යි කියන ඒක පැහැදිලි යි නේ ද? ඒ වගේ කෙස් කියන ටික කෙනෙක් නො වෙයි ම යි.

ඊට පස්සේ මේ ශරීරයේ තියන ලොම්, රෝමකූප ටික කපලා අපි පැත්තකට දැම්මොත් කෙනෙක් ව පෙනෙනව ද? නෑ. රෝමකූප ටික විතරක් පෙනෙයි. ඒ රෝමකූප ටික කියන්නෙත් අර හුඹහෙ තිබ්බ මැටි ටිකට සමානම ම යි, පඨවි ධාතුව. ඊට පස්සේ නිය, දත්, හම, මස්, නහර, ඇට, ඇටමිදුළු මේ වගේ තද කොටස් විස්සක් මේ ශරීරයේ තියෙන්නේ. ඔය හැම කොටසක් ම සමානම ම යි, කිසිදු වෙනසක් නෑ, අර පඨවි ධාතුවට. හුඹහකින් කොටලා ගත්ත මැටි ටිකට සමානම ම යි.

ඊට පස්සේ ළිඳක, වැවක, පොකුණක තියන වතුර ටිකක් ගත්තොත්, ඒ වතුර ටික කෙනෙක් පුද්ගලයෙක් කියලා හිතෙනව ද පින්වතුන්ට? නෑ. ඒ ස්වභාවයට කියනවා ආපෝ - ගලන වැගිරෙන ස්වභාවයට කියනවා ආපෝ කියලා, ජලය. අපි නැන්ද, මාමා, දුව, පුතා, අම්මා, අප්පච්චි කියලා හිතාගෙන ඉන්න ශරීරයක භෞතික ස්වභාවය පිත, සෙම, සැරව, ලේ, දඩිය, මේද තෙල්, කඳුළු, වුරුණු තෙල්, කෙළ, සොටු, මුත්‍රා කියලා ගන්න මේවා, ලේ ටිකක් ගත්තොත්, කෙළ ටිකක් ගත්තොත්, සොටු ටිකක් ගත්තොත්, නැන්ද, මාමා, අයියා, තාත්තා, අම්මා කියලා සොටු ටිකේ පෙනෙනව ද? නැද්දකම? නෑ. ඒ ගලන වැගිරෙන ස්වභාවය යි, ළිඳේ, වැවේ තියන ස්වභාවය යි සමානම ම යි. (හිත කොහාටවත් යන්නේ නැතුව හොඳට අහගෙන ඉන්න)

බාහිර හිරු රශ්මිය නිසා හෝ ගිනි ගොඩක් නිසා හෝ අපට උණුසුමක් දැනුනොත්, ඒ ගින්නෙන් එන උණුසුම යි, මේ ශරීරයේ පැවැත්මට හේතු වෙන, කන බොන ආහාරපාන දිරවන්න හේතුවෙන, ඉන්ද්‍රිය මුහුකුරන්න හේතු වෙන, ශරීරයේ පැවැත්මට

හේතුවෙන උණුසුම යි සමානම ම යි. කිසිදු වෙනසක් නෑ. බාහිර ගස්වැල් සොලවමින් හමන සුළඟක් දිහා බලන්න, සුළඟට බඩුභාණ්ඩ උඩ යවන්න පුළුවන්, විසිරවන්න පුළුවන්, තැන තැන ගෙනියන්න පුළුවන්. නමුත් සුළඟ කියන්නේ කෙනෙක් ද? පුද්ගලයෙක් ද? සත්ත්වයෙක් ද? නෑ. ඒ වගේ ම යි මේ ශරීරයක තියන අශ්වාස, ප්‍රශ්වාස වාතය, ඉක්කාව, ඔක්කාරය එන උද්ධඞ්ගම වාතය, මල මූත්‍ර බැහැර කරන අධෝගම වාතය මේ කියන වාත ස්වභාවයන්. කෙටියෙන් ගත්තහම අපි මෙච්චර කාලයක් නැදැකමින් පවත්වපු, පවත්වන දකින මේ ලෝකයේ සත්ත්වයින් පුද්ගලයින් කියලා හිතන මේ ලෝකයේ තියන රූපවල භෞතික නිර්මාණය පඨවි, ආපෝ, තේජෝ, වායෝ කියන සතර මහා ධාතුන්ට යි අයිති.

අර මැටි ටික අවකාශ ධාතුව තුළ එක එක හැඩ වලට රාශි කරලා තිබ්බා වගේ, අවකාශ ධාතුව තුළ සතරමහාධාතුව එක එක ආකාරයෙන් රාශි වෙලා මේ තියනවා. අපි දැක්කා මැටි ටික අහුවෙන්නේ නැතුව හැඩය අල්ලන්න බැහැ නේ. නේ ද? ඒ වගේ මේ කිසිම රූපයක සතරමහාධාතුව අහු නො වී හැඩය අල්ලන්න බෑ. මේ සතරමහාධාතුව අවකාශ ධාතුවේ රාශි වෙලා තියන හැඩය යි. ඔන්න ඔය සතරමහාධාතු රූප මිටියක් අපේ ඇස් ඉදිරිපිටට එනකොට, සතරමහාධාතු රූපය කියන්නේ සත්ත්වයෙක් ද? පුද්ගලයෙක් ද? නෑ, සත්ත්වයෙක් හෝ පුද්ගලයෙක් හෝ ආත්මයක් හෝ නො වෙයි ම යි. අපි භෞතික රූප ටික ඔක්කොම විශ්ලේශණය කරලා බැලුවහම, එබඳු වූ රූපයක් අපේ ඇස් ඉදිරිපිටට එනකොට රූපයේ ඇත්ත නො දන්නාකම නිසා, අර මැටි ටිකේ රූපය පෙනෙන කොට අපි ගව රූපයක් කියලා හිතුවා නේ, ඒ වගේ අර සතරමහාධාතු රූපය අපේ ඇස් ඉදිරිපිටට එනකොට ඒ රූපය අරබයා මේ මගේ දරුවා නේ කියලා අපි හිතනවා. හිතලා ඒ රූපය දිහා දරුවා කියන අදහසින් බලනවා.

බැලුවහම පින්වතුනි, දැන් තියන දෝෂය තමයි සතරමහාධාතුව තියන තැන මේ දරුවා කියන හැඟීමට, කෙනෙක් කියන හැඟීමට කියනවා **අත්තවාද උපාදානය** කියලා. දරුවෙක් කියන හැඟීමෙන්

රූපය දිහා බැලුවහම තියන දෝෂය තමයි පුද්ගලයෙක් නිර්මාණය වෙනවා. දැන් අර රූපය අපට පෙනෙන්නේ කොහොම ද? කෙනෙක් වගෙ යි.

අර වගේ ම සතරමහාධාතුව අවකාශ ධාතුවේ රාශි වෙලා තියනවා. ඒ සතරමහාධාතු රූපයක හැඩය අපේ ඉස්සරහට එනකොට ඒ හැඩයට අපි හිතනවා 'අම්මා' කියලා. අම්මා කියලා හිතනවා විතරක් නො වෙයි, ඔය හිතේ තියන නිමිත්තෙන් ඒ රූපය දිහා බලාගෙන 'අනේ අම්මා මෙහෙම මෙහෙම උදව් කළා, මෙහෙම කළා' කියලා බොහොම සෙනෙහස, ආදරය කියන ගති තමන් තුළ ඇතිවෙන විදිහටත් හිතනවා. හිතලා අපේ සිතේ තියන අදහසින් අම්මා කියලා අර රූපය දිහා බැලුවහම, දැන් අර මැටි ටික, සතරමහාධාතුව වැහිලා, අපට ඒ රූපය පෙනෙන්නේ කොහොම ද? අම්මා වගේ, කෙනෙක් නිර්මාණය වෙලා. පුද්ගලයෙක් ඉපදෙනවා.

මේ වගේ රූපයේ ඇත්ත නො දන්නාකම නිසා ලෝකයා කියන්නේ ඇස් ඉදිරිපිටට එන එන රූප වලට සත්ත්ව, පුද්ගල හැඟීමක් සිතේ ආරෝපණය කරගෙන, (ඒකට කියනවා තණ්හා, උපාදාන කියලා - කෙලෙස්) දරුවා කියන අදහස සිහිකරන්න, සිහි කරන කොට ඒ සිතේ තියන හැඩය ඒ නිමිත්තට බලන්න තමන්ගේ කැමැත්තක් තියෙ යි. කෙනෙක් කියන හැඟීමත් හිතේ තියෙයි. ඔය කැමැත්ත යි, ඔය හැඟීම යි අර සතරමහාධාතු රූපය පැත්තට තැබුවහම තියන දෝෂය තමයි, කෙනෙක් නිර්මාණය වෙනවා. පුද්ගලයෙක් නිර්මාණය වෙනවා.

ඊට පස්සේ දැන් අපි සතරමහාධාතු රූප ටික ඇස් ඉදිරිපිටට එන එන හැඩ වලට අම්මා, තාත්තා, දුව, පුතා, අයියා, අක්කා, නැන්දා, මාමා, සීයා, ආච්චි කියලා හිත හිත ඒ විදිහට අපි මේ රූප ටිකට සිත තබනවා. දැන් අවකාශ ධාතුව තුළ රාශි වෙච්ච සතරමහාධාතු රූප මිටිය ඉහිරෙන දවසක් එනවා ම යි. දිරන දවසක් එනවා ම යි රූපය. එතකොට අපට පෙනෙන්නේ කොහොම ද? 'අම්මා ලෙඩ වුණා, අම්මා මැරුණා, තාත්තා ලෙඩ වුණා, තාත්තා මැරුණා, දුව

ලෙඩ වුණා, පුතා ලෙඩ වුණා, පුතා මැරුණා' කියන තැනකින් තමයි අපට දුක එන්නේ.

මේ දුකට හේතුව ජාතිය යි. මොකක් ද ජාතිය? දරුවෙක්ගේ ඉපදීම. අම්මාගේ ඉපදීම, තාත්තාගේ ඉපදීම, තමන්ගේ ඉපදීම, මේ ශරීරය තමන් කියන එකත් එහෙම යි. එතකොට ජරාමරණ දුකට හේතුව මොකක් ද? ජාතිය යි. ජාතිය කියන කොට ඉපදීම කියන කොට, අපි බොහෝ දෙනෙක් හිතාගෙන ඉන්නේ, හිතාගෙන හිටියේ මව් කුසකින් බිහිවෙන එක තමයි ඉපදීම කියලා. ඔය ඉපදීම මේ සාසනයෙන් බැහැර අයත් දන්නවා. එතන පුද්ගලයෙක්ගේ ඉපදීම නෙවෙයි වුණේ, එතන සතරමහාධාතු රූපයේ ඉපදීමයි වුණේ, ස්කන්ධ ටික විතරයි උපන්නේ. තවම ස්කන්ධ ටිකේ අයිතිකරුවා නෑ. දුක් විඳින පුද්ගලයා නිර්මාණය වෙලා නෑ. අපි මෙහෙම හිතුවොත්: 'අන්න ඔයා ගැන මහා නුගුණයක් අහවලා කිව්වා' කියලා කිව්වොත් තමන්ට ලැජ්ජා හිතෙනවා හෝ දුක හිතෙනවා වෙන්නෙ නැත් ද? වෙනවා. ඒ දුක, ලැජ්ජාව විඳින්නේ පුද්ගලයා යි. සතරමහාධාතුවට නෙවෙයි ඒ දුක එන්නේ, පුද්ගලයට යි එන්නේ. එතකොට 'ඔයාට අහවලා බණිනවා' කිව්වොත්, අහවලෙක්, තව කෙනෙක් උපද්දවපු නිසයි, තමන්ව උපද්දපු නිසයි තමනුත්, තමන්ට බණින්නත් කෙනෙක් ඉන්නේ. තේරුණා ද මම කියපු එක?

ඒ වගේ ම දැන් මෙහෙම ඉන්න කොට කන කැපුවොත්, තමන්ගේ කන කැපුවා වෙන්නේ නැත් ද? මගේ කන කැපුවා කියන දුකම එනවා නේ ද? ඒ පුද්ගලයාට යි රිදෙන්නේ. පඨවි ධාතුවට තේරෙන්නේ නෑ, පුද්ගලයාට යි දැනෙන්නේ (දුක් වේදනාව නෙවෙයි). ලෝකයා එක ස්පර්ශයකින් දෙ පාරක් දුක් විඳිනවා. කන කපන කොට කාය සම්පස්සයෙන් එන දුක් වේදනාවකුත් දැනෙයි, මගේ කන නැතිවෙච්ච දුකත් විඳියි. ඇසක් ගැලෙව්වොත්, අතක් කැපුවොත්, කකුලක් කැපුවොත්, ගැහුවොත්, 'මට බැන්නා, මගේ ඇස අන්ධ වුණා, මගේ කකුළ කැඩුනා' කියලා පුද්ගලභාවයකින් දුක් එනවා නේ ද? ලෙඩ වෙන කොට මම අහවල් ලෙඩෙක්, මට අහවල් පිළිකාව තියෙයි, අහවල් රෝගය තියෙයි කියලා තමන්ට

දුක් විඳින්න පුළුවන් නේ ද? තමන් මැරෙයි කියලා හිතලා දුක් විඳින්න පුළුවන් නේ ද? ඒ ඔක්කොම තමන් උපන්න නිසා යි, තමන්ගේ ඉපදීමට යි.

පින්වතුන් දන්නව ද තමන්ව ඉපදෙන්න හේතුව මොකක් ද කියලා? තමන්ව ඉපදෙන්න ක්‍රම දෙකක් තියෙනවා, මම උපමාවක් කළොත්: සිනමා ශාලාවල චිත්‍රපටි බලලා තියනවා නේ ද? සිනමා ශාලාවකට ගියාම (මම කියන එක ඇත්ත ද කියලා ගිහිල්ලා බලන්න) නෙගටිව් (negative) එකේ තියන රූ සටහන අරගෙන කැමරාව හරහා ආලෝක ධාරාවක් එනවා නේ ද? ඒ එන ආලෝකයේ තියෙන්නේ නෙගටිව් (negative) එකේ තියන රූ සටහන යි. ඕක පතිත වෙන්න තිරයක් නො තිබුනොත් අපට රූප පෙනෙයි ද? නෑ. හොඳයි, තිරය තියනවා, නෙගටිව් (negative) එකේ රූ සටහන අරගෙන එන්න ආලෝක කිරණ නැත්නම්, රූප පෙනෙයි ද? නෑ. නෙගටිව් (negative) එකේ රූ සටහන අරගෙන එන ආලෝක කිරණයට තිරයක් හම්බ වුණොත්, ආලෝක කිරණත් තියනවා, ඒක පතිත වෙන්න තිරයකුත් තිබුනොත් මොකක් වෙයි ද? අපට රූප පෙනෙයි. එහෙම නේ ද?

ඒ වගේ නොයෙක් නොයෙක් ආකාරයට මැටි ටික අවකාශ ධාතුවේ රාශි කරලා තියන හැඩ ටික (හුඹහක් කොටලා ගත්ත මැටි ටික) දකින්න තිරය වගේ කියලා. ඕක අපි දැකලා මනුස්සයෙක්ගේ රූපය, අශ්වයෙක්ගේ රූපය, ස්ත්‍රියකගේ රූපය, පුරුෂයෙක්ගේ රූපය කියන අදහස් ටික ඇතිකරගෙන මේ අදහස් ටිකේ සටහන ඇතුව, එබඳු සිතකින් මැටි ටික දිහා බලන කොට හරියට අර නෙගටිව් (negative) එකක රූ සටහන අරගෙන ආලෝක කිරණ ටික වැටෙනවා වගේ, මම මනුස්සයෙක්ගේ හැඩය, ස්ත්‍රියකගේ හැඩය කියලා බලන කොට සතරමහාධාතු රූපයක් අහු නො වුණොත්, ඒත් මට බලු රූප, ස්ත්‍රී රූප හම්බවෙන්නේ නෑ. අදහස තියාගෙන පෙනුන රූපයට මම බලන්න හදන කොට රූපය නැත්නම් එබඳු රූප හම්බවෙනවා ද? නෑ. හොඳයි මැටි ටික මැටි හැටියට දැකලා මම අශ්වයෙක්, හරකෙක්, මනුස්සයෙක් කියලා හිතන්නේ නෑ.

බලන්නේ නෑ. මැටි ටික මැටි හැටියට දකිනවා. එතකොටත් මනුස්සයෙක්, ස්ත්‍රී රූපයක් උපදියි ද? උපදින්නේ නෑ.

ඒකෙන් මම මතක් කලේ අද පින්වතුන් සිහි කරන්න තමන්ගේ දරුවෙක්ව, ඔන්න ඔය දරුවා කියලා සිහිකරන දේ හැදිලා තියෙන්නේ කොහොම ද දන්නවා ද? අර අපි ඉස්සල්ලා කිව්ව විදිහට ම කනබොන ආහාරයෙන් හැදුණු සතරමහාධාතු රූප මිටියක් තමයි ඇස් ඉදිරිපිටට ආවේ. වෙන මොකුත් ම නෑ. ඒ රූප මිටියක් එන කොට රූපයේ ඇත්ත නො දන්නාකම නිසා මේ රූපයේ නිමිත්ත සිතට අරගෙන, මේ මගේ දරුවා කියලා තණ්හාව ඇතිවෙන විදිහට හිතලා, දැන් බලන්න ඒ නිමිත්ත සිහි කරන කොට හිතේ කැමැත්ත, ආදරය කියන ගතියක් තියනවා නේ ද ඒ නිමිත්ත එක්ක? ඊට පස්සේ නමත් එක්ක මේ දරුවා, පුද්ගලයා කියන හැඟීමත් තමන්ගේ තියනවා. ඔන්න ඔය ටිකට තමයි අර නෙගටිව් (negative) එකේ රූ සටහන ගත්ත ආලෝක කිරණ වගේ, ඔන්න ඔය ආදරය සෙනෙහස කියන හැඟීම් ටිකත්, සත්ත්වයෙක්, පුද්ගලයෙක්, දරුවෙක් කියන හැඟීමත් ආරෝපණය කරගත්ත සිතකින් කනබොන ආහාරයෙන් යුක්ත රූපය දිහා බැලුවහම තියන දෝෂය - ඕකට තමයි බුදුරජාණන්වහන්සේ තණ්හා, උපාදාන, භව කියලා කියන්නේ, භව කියලා කියන්නේ. මේ කාම භවය කියන්නේ සතරමහාධාතු රූපයට යි. තණ්හාව කියලා කියන්නේ දරුවා කියන කොට, සිහි කරන කොට සිතේ ඇතිවෙන කැමැත්ත යි. මේ දරුවා ම යි කියන පුද්ගල හැඟීමට තමයි උපාදානය කියන්නේ. ඔය දෙක සතරමහාධාතු රූපය පැත්තට තැබුවහම වෙන්නේ මොකක් ද? ජාති කියන්නේ, ඒ රූපය කෙනෙක් වගෙයි තමන්ට පෙනෙන්නේ. සතරමහාධාතු රූපය අම්මා හැටියට යි පෙනෙන්නේ. තාත්තා හැටියට යි පෙනෙන්නේ. දුව, පුතා හැටියට යි පෙනෙන්නේ. මම හැටියට යි පෙනෙන්නේ.

අපට මේ ජීවත්වෙන ලෝකය, ඒකයි සතරමහාධාතු රූපය හරියට තිරය වගෙ යි. ඒ සතරමහාධාතු රූප අරබයා, දැන් මෙහෙම ඉඳගෙන තාත්තාව සිහි කරන්න පුළුවන් නේ. අම්මාව සිහි කරන්න පුළුවන් නේ. සිහි කරන ඔය නිමිති ටිකට තමයි තණ්හා උපාදාන

කියන ගති බුදුරජාණන්වහන්සේ පෙන්නන්නේ. ඔය තණ්හා, උපාදාන කියන ගති (ඒ හිතේ තියන පුද්ගල ස්වභාවයත්, තණ්හාවත්) විතරක් තිබුණොත්, සතරමහාධාතු රූපයක් අහුවුණේ නැත්නම්, ඒත් ජාතිය නෑ. ඉපදෙන්න විදිහක් නෑ. අපි නිකමට කිව්වොත් ඔය ඇත්තන්ට මැරිච්ච කවුරුහරි ලඟම නෑදෑ කෙනෙක් සිහිකරන්න, හැමෝට ම පුළුවන් නේ සිහිකරන්න? දැන් සිහිකරන කොට හිතේ සත්ත්ව, පුද්ගල හැඟීමත් හොඳට තියෙයි, ඒ ආදරය සෙනෙහස කියන ගති ටිකත් තියෙයි. ඒ කියන්නේ තණ්හා උපාදාන කියන ටික තියනවා. ***රූපං අත්තතො සමනුපස්සති*** - රූපය ආත්ම වශයෙන් දකින එකට කියනවා **අත්තවාද උපාදානය.** ආත්මයක් කියන හැඟීම, පුද්ගලයෙක්, සත්ත්වයෙක් කියන හැඟීමට කියනවා **දිට්ඨි උපාදානය.** මේ හිතේ ඇති ගති යි. ඒ එක්ක ආදරය, සෙනෙහස කියන ගතිත් තියෙයි. දැන් තමන්ගේ මැරිච්ච ඥාතියාව සිහි කරන්න. සිහි කළාට එයා ඉන්නව ද? නෑ. නෑ කියන්න තියන සාක්ෂිය මොකක් ද? ඔය හිතේ තියන ගතිය හැපිලා පවතින්න වර්තමාන සතරමහාධාතු රූපයක් නෑ. හොඳට බලන්න කනබොන ආහාරයෙන් හැදුනු කෙස්, ලොම්, නිය, දත්, හම්, මස් කියන කුණප කොටස් තිස් දෙකෙන් යුක්ත සතරමහාධාතු රූපය විතරයි නැත්තේ, සිහි කරන්න පුළුවන් ගතිය ඉබේම තියෙ යි. එතකොට හිතන්න පුළුවන් ගතිය, සිහි කරන්න පුළුවන් ගතිය තියනවා නමුත් ඒ ගතියට අහුවෙන්න වර්තමාන සතරමහාධාතු රූපයක් නැති වුණහම මොකද වෙන්නේ? ජාතිය නෑ, ඉපදිච්ච කෙනෙක් ඉන්නව ද? නෑ, එතකොට කියනවා මොකක් ද? මැරිලා.

හැබැයි දැන් සිහි කරන්න පුළුවන් ගතියට අතීත සතරමහාධාතු රූපය ඇසුරු කළොත් 'හිටියා' කියලා අපට දැනෙයි. අතීතයේ දීත් දැකපු තැනක තිබුණේ සතරමහාධාතු යි කියලා අතීත රූපය පිරිසිඳ දැක්කේ නැත්නම් - ඒකයි රූපය අතීත, අනාගත, වර්තමාන, ආධ්‍යාත්මික, බාහිර කියන මේ තුන් කාලයෙන් ම බලන්න කියන්නේ. හොඳට බලන්න දැන් අපට තාත්තා සිහි කළ හැකි යි. යම් ආදරයක්, සෙනෙහසක් තියනවා නම් ඔක්කොම ටික තියෙයි. තිබුණට සිහි කරන කොට හිත නැමිලා පවතින්න, හිත බරවෙලා පවතින්න සතරමහාධාතු රූපයක් නෑ වර්තමානයේ. එතකොට

කියනවා මොකක් ද? ඉපදිලා නෑ. දැන් ඒක ඇත්ත ද එතකොට? ජාතියක් තියෙනව ද? කෙනෙක්ගේ ඉපදීම තියනව ද දැන්? හිතේ ගතිය තියනවා තාත්තා කියලා සිහි කළ හැකියි මට. නමුත් මට ඒක ඇත්ත ද දැන්? ගණුදෙණු කරන්න පුළුවන් ද? ජීවත් වෙනව ද? නැහැ.

නමුත් මගේ හිතේ තියන ඔය ගති ටිකට කන බොන ආහාරයෙන් හැදුණු සතරමහාධාතු රූප මිටියකුත් අහු වුණොත්, එතකොට මොකද වෙන්නේ? තාත්තා ඉන්නවා. අල්ලන්න පුළුවන්, කතා කරන්න පුළුවන් - තාත්තා ඉන්නවා වෙනවා.

ඒ වගේ ම යි, පින්වතුන් දන්නවා ද එතකොට තාත්තා උපදින්න, තාත්තා ඇති වෙන්න ක්‍රම දෙකක් තිබුණා. සතරමහාධාතු රූපයත් ඕන වුණා, ඒ රූපය තාත්තා කියන හැඟීම ඇතුව, දෘෂ්ටිය ඇතුව ඊට නැඹුරු වෙච්ච බවකුත් තියෙන්න ඕන වුණා. මේ ගති දෙක, ස්කන්ධ සහ කෙලෙස් කියන ගති දෙක, නැත්නම් තණ්හා, උපාදාන, භව කියලා කියන්නේ ඒක යි. භව කියන්නේ කාම භවය නියෝජනය වෙන්නේ හැම වෙලාවේ ම සතරමහාධාතු රූපයකින්.

ඔය ටිකේ දෝෂය මොකක් ද? සතරමහාධාතු රූපය තිබුණොත් මම 'තාත්තා' කියලා හිතන කොට, ඒ ගතිය සතරමහාධාතු රූපයට නැඹුරුත් වුණොත්, මට මේ ගති දෙක නිසා තාත්තා කෙනෙක්ගේ ඉපදීම ලැබෙනවා. සතරමහාධාතු රූපය දිරන්න, දිරන්න මට පෙනෙන්නේ තාත්තා වයසට යනවා වගෙ යි. සතරමහාධාතු රූපය කැඩුණොත් බිඳුණොත් මට තේරෙන්නේ තාත්තා මැරුණා වගෙ යි. ඊට පස්සේ තාත්තාට බැණපු දුක, ගහපු දුක, නින්දා කරපු දුක, අපහාස කරපු දුක කියලා සත්ත්ව පුද්ගලභාවයෙන් මම යම් තාක් දුක් විඳියි නම්, ඒ තාත්තාගේ ඉපදීම නිසා යි.

ඉපදීමට ළඟ ම කාරණාව කාම භවය, නැත්නම් භවය කියලා කියන්නේ සතරමහාධාතු රූපය යි. භවයට හේතු වුණේ, සතරමහාධාතුව ගාවට එන්න හේතු වුණේ, ඒ රූපය සත්ත්වයෙක් පුද්ගලයෙක් කියන අත්තවාද උපාදානය යි. ඒකට එන්න හේතු වුණේ එයාට කැමතියි, ඒ රූපයට කැමතියි කියන තණ්හාව යි. මේ

තණ්හා උපාදාන කියන ගති දෙකෙන් තමයි හොඳයි, කෙනෙක් කියන ටිකයි මේ රාමුව තියෙන්නේ මේ හිතේ. (තේරුණා නේ ද කියන එක?) එයා හොඳයි, පුද්ගලයෙක්. අම්මා, තාත්තා කියන ගති දෙක කියන කොට තණ්හා උපාදාන කියන ගති දෙක තියෙනවා. ඒක සතරමහාධාතු රූපයට තැබුවහම මොකද වෙන්නේ? භව යි. සතරමහාධාතු කිව්වේ භව යි. භව වුණොත් වෙන දෝෂය මොකක් ද? ජාති යි. ජාති කිව්වේ මොකක් ද? පුද්ගලභාවයේ නිර්මාණය යි.

මෙතන බුදුරජාණන්වහන්සේ ඉපදීම දුකක් කියලා දේශනා කළේ, මේ මම, මේ මගේ දුව, පුතා, අම්මා, තාත්තා, අයියා, අක්කා, රන් රිදී, මිල මුදල් කියලා මේ ලෝකයේ නිර්මාණය, ලෝකයේ ඉපදීමට යි බුදුරජාණන්වහන්සේ ජාතිය කියලා පැනෙව්වේ. ***ජාති පච්චයා ජරා මරණ, සොක, පරිදෙව, දුක්ඛ දොමනස්ස උපායාසා සම්භවන්ති*** - බලන්න මේ ඉපදුණු අය නිසා නෙවෙයි ද ලෙඩ වීම, මහළු වීම, මරණය, දරුවන් අකීකරු වීම, මේ ප්‍රශ්න ගැටළු ඔක්කෝම තියෙන්නේ දරුවන් ඉන්න හින්දා, තමන් ඉන්න හින්දා නෙවෙයි ද?

ශ්‍රැතවත් ආර්‍ය්‍ය ශ්‍රාවකයා දන්නවා දුක්ඛ ඤාණං - ඉපදීම දුකක් කියලා දන්නවා. උපන්නොත්, තමන් උපන්නොත් තමන්ට බැණුම් අහන්න වෙනවා, නින්දා අහන්න වෙනවා, සීතෙන්, උෂ්ණයෙන්, මැසි මදුරු, අව් සුළං වලින් පීඩා විඳින්න වෙනවා, ගුටි කන්න වෙනවා, අනිත් නෑදෑයින් ලෙඩ වෙච්ච, මැරිච්ච දුක් විඳින්න වෙනවා, තමන්ගේ අතපය කැපිච්ච, කුඩු වෙච්ච - මේ දුක් විඳින්න වෙනවා තමන් උපදවා ගත්තොත්. අම්මා, තාත්තා, අයියා, අක්කා, දුව, පුතා උපදවා ගත්තොත්, ප්‍රිය විප්පයොග දුක්ඛ, අප්‍රිය සම්ප්‍රයොග දුක්ඛ, හිතන දේ නො ලැබීමේ දුක් - මේ සියලු දුක් විඳින්න වෙනවා. තේරුණා නේ ද?

ඒ විදියට ම යි කාම උපාදානය සතරමහාධාතුවට පතිත කළහම කාම වස්තු නිර්මාණය වෙනවා. රන් රිදී, මුතු මැණික්. අපි අර කලින් කියපු දේ ගන්න. වස්තුවක භෞතික තත්ත්වය හොඳට විමර්ශණය කළොත්, පිදුරු, කෙමිකල් වගේ දෙයකින් තමයි කඩදාසි

වගේ දේවල් නිර්මාණය කරන්නේ. ඔය කඩදාසියක යම් චිත්‍රයක්, වර්ණයක් ඇඳලා තිබ්බොත්, ඒ ඇහැට පෙනෙන චිත්‍ර සටහන කාටත් සමාන යි. ඔය චිත්‍රයක් අපේ ඇස් ඉදිරිපිටට ආවොත් සමහර විට අපට මේක රුපියල් පන්දහක් කියලා හිතෙන්න පුළුවන්. පන්දහක් කියලා හිතන කොට, පන්දහක් කියලා දකිනවාත් එක්ක ම, ඒ තමයි කාම උපාදානය. එතකොට ම වටිනාකමකුත් තියෙයි. පන්දහ වටිනාකමෙනුත්, වටිනාකම පන්දහෙනුත් වෙන් කරන්න බැහැ. පන්දහක් කියලා දකින වටිනාකම අප තුළයි ඇතිවෙන්නේ කියලා කියන්නේ, පොඩි ළමයෙක් ඔය රූපය දකියි, නමුත් එයාට මේකේ වටිනාකමක් තේරෙනවා ද? නැහැ. පෙනීම සමාන යි. පෙනෙන දෙය තුළ මේ වටිනාකම තිබුණා නම් කාටත් එන්න ඕන.

ඊගාවට අපි කියමු සම්මතයක් දැම්මොත් අද ඉඳලා මේ කොළය වලංගු නැහැ කියලා, එදාටත් පෙනෙයි. ඒත් වටිනාකම එන්නේ නැති වෙයි. එතකොට කඩදාසිය දකින කොට පන්දහක් කියන වටිනාකම සහ පන්දහක් කියන දැක්ම ඇතිවෙන්නේ කා තුළ ද? තමන් තුළ යි. ඒ හිතේ තියෙන ගති ටික, පන්දහක් කියන ගති ටික අර පිදුරු, කෙමිකල් ටිකකින් හැදුණු කඩදාසිය මත පතිත කළොත්, සතරමහාධාතු රූපය මත පතිත කළොත් තියෙන දෝෂය මොකක් ද? පන්දහක් උපදිනවා. පන්දහේ කොළයක් පින්වතුන්ට උපදියි. පිදුරු, කෙමිකල් වලින් හැදුණු කඩදාසියත් නෙවෙයි පන්දහ. එහෙම නැතිනම් ඒක විතරක් තිබුණත් පන්දහ උපදින්නේ නැහැ. වටිනාකමක් මනසේ නො ලැබුණොත් උපදිනවා ද? නැහැ.

ඒ රූපය තිබුණාට මනසේ ඒ රූපය පන්දහ නේ, මෙච්චර වටිනවා නේ කියලා රූපය දකින කොට කෙනා කෙනාගේ මනස තුළ වටිනාකම් ආවේ නැත්නම් පන්දහේ කොළයක් නිර්මාණය වෙන්නේ නැහැ. මනස තුළ පන්දහේ කොළයක් තියෙනවා, ඒක වටියි කියලා දන් සිහි කරන්න පුළුවන්. නමුත් ඇස් ඉදිරිපිටට කඩදාසිය ඇවිල්ලා නැත්නම්? ඒත් පරිහරණය කරන්න, දුක එන්න පන්දහක් ඉපදිලා තියෙනවා ද? නැහැ. මනසේ ඔය ගති ටිකත්,

ඇස් ඉදිරිපිටට රූපයත් ආවොත් මොකක් වෙයි ද? පන්දහක් උපදියි.

දැන් පන්දහේ කොළයක් උපන්නා කියන්නේ ඒ කොළය ඉරුණොත් තමන්ට දුක එනවා ද නැත් ද? එනවා. කඩදාසියක් ඉරුණොත් තමන්ට දුක එන්නේ ඇයි? ඔය කඩදාසිය පිච්චුණොත් තමන්ට දුක එනවා ද නැත් ද? වේයො කැවොත්, මීයො කැවොත්? කඩදාසි කෑල්ලක් වේයො කන කොටත් තමන්ට දුක එනවා නම්, කඩදාසි කෑල්ලක් මීයො කන කොටත්, ඉරෙණ කොටත් දුක එනවා නම්, ඔය දුකට හේතුවක් තියෙන්න ඕන නේ ද? ඉපදීමකින් තොරව දුකක් තියෙයි ද? දුකට හේතුව මොකක් ද? ජාතිය. කාගේ ජාතිය ද? තමන්ගේ වේවා, වස්තූන්ගේ වේවා, ජාතිය ස්වභාව කොට ඇති යම් තාක් දෙය තියෙයි ද, හැම දෙයකින් ම දුක එයි. පින්වතුන්ට ඒ දුක ආවේ පන්දහක් ඉපදුණු නිසා යි. පන්දහක් පින්වතුන්ට උපන්නේ කුමක් නිසා ද? ඇස් ඉදිරිපිටට ආපු රූපයේ ඇත්ත නො දන්නාකම නිසා මේක පන්දහක්, මෙච්චර වටිනවා කියන හැඟීමක් ඇති කරගෙන, ඒ හැඟීමෙන් අර රූපය පැත්තට නැඹුරුවෙච්ච නිසා යි.

පන්දහක් වටිනවා කියන කොට වටිනාකම දැනෙන එකට කියනවා තණ්හාව, පන්දහක් කියලා තේරෙන එකට කියනවා කාම උපාදානය කියලා. තණ්හා, උපාදාන. භව කියලා කියන්නේ කඩදාසිය තියෙන පැත්තට හිත තැබුවහම ජාති - පන්දහේ කොළයක් උපන්නා.

දුක උපද්දවාගෙන පරිහරණය කරන්නේ. ඒ වගේ, කඩදාසි කොළය වගේ තමයි කන බොන ආහාරයෙන් හැදුණු කිසිම වටිනාකමක් නැති, විඤ්ඤාණය නිරුද්ධ වුණහම ඉදිමිලා, නිල්වෙලා, පුපුරලා, පොළවට දියවෙලා යන, පස්වෙලා යන සතරමහාධාතු රූප මිටියක් විතරයි ඇස් ඉදිරිපිටට එන්නේ. අර පිදුරු කෙමිකල් ටිකකින් හැදුණු කඩදාසිය වගේ, සතරමහාධාතු රූපය. ඕක දකින කොට වටිනාකමින්, ආදරය සෙනෙහස කියන එකට තමයි තණ්හාව කියන්නේ. කාම උපාදානය. ඔය කාම උපාදානයට

අත්තවාද උපාදානයත් එකතු වුණොත් සත්ත්වයෙක්. දිට්ඨි උපාදානයත් එකතු වුණොත් ආත්මයක් කියලා එතකොට තමන්ට පෙනෙයි, හිතේ ඇතිවෙයි ගතියක් දරුවා - දරුවාට ආදරෙයි. තාත්තා - තාත්තාට ආදරෙයි. අම්මා - අම්මා ආදරෙයි වගේ තැනකින් තමයි මේ පුද්ගලභාවය යි, තණ්හාව යි කියන ගති දෙක මනසේ එකතු වුණහම.

ඔය ගති ටික සතරමහාධාතු රූපයට තැබුවහම පින්වතුන්ට අර පන්දහක් නිර්මාණය වුණා වගේ නිර්මාණය වෙයි තමන් ව. නිර්මාණය වෙයි අම්මා, තාත්තා, අයියා, අක්කා, නැන්ද, මාමා, නංගි, මල්ලි - මේ වගේ මිනිසුන්, සත්ත්වයින්, පුද්ගලයින් නිර්මාණය වෙයි. ඉපදෙයි. උපන්නහම ඒ සත්ත්ව පුද්ගලයන්ට ජරා මරණ දුක අයිතියි ම යි. ජරා මරණ දුක විඳින්න වෙනවා.

එතකොට ශ්‍රැතවත් ආර්‍ය ශ්‍රාවකයා දන්නවා තමන්ගේ වේවා, අනිත් සත්ත්වයින්ගේ, පුද්ගලයින්ගේ වේවා, ද්‍රව්‍ය කාරණාවන්ගේ වේවා, ඉපදීමක් තිබුණොත් දුකෙන් වෙන් වෙන්න බැහැ ම යි. ඉපදීම ම දුකක්.

අපි නිකමට කිව්වොත් දැන් මෙහෙම ඉන්න කොට වාතයක් එහෙම ගියොත් කාටත් ලැජ්ජා හිතෙයි ද, නැත් ද? හිතෙයි. ඇයි ලැජ්ජා හිතෙන්නේ? තව අය ඉන්න හින්ද නෙවෙයි ද? තමනුත් ඉන්න හින්ද, තව අයත් ඉන්න හින්ද නෙවෙයි ද? මේ ලෝකය ඇත්ත වෙච්ච බව ම දුකක්. හොඳට දකින්න. වෙන අමුතු දුකක් එපා. මේ ලෝකය ඇත්ත වෙච්ච බව ම දුකක්. මේ ඉපදීම ම දුකක් අපට. රහතන්වහන්සේ නමකටත් එහෙම දුක එයි ද? ලැජ්ජාව එයි ද? නැහැ. ඇයි එන්නේ නැත්තේ? ඉපදීම නැති කරලා. කාගේ ද? තව සත්ත්වයන්, පුද්ගලයන්ගේ, තමන්ගේ ඉපදීම නැති වෙලා. තේරුණා නේ ද?

එතකොට ඉස්සෙල්ලා ම ඉපදීම දුකක් බව දන්නවා එයා. උපන්නොත් ජරා, මරණ, සෝක, පරිදේව, දුක්ඛ, දෝමනස්ස, උපායාස ඇති වෙනවා ම යි තමන්, අනුන් සහ ඕනෑම වස්තුවක් අරබයා. ඉපදුනේ කොහොමද කියන එක දන්නවා - කාම ධාතුවේ

නම් සතරමහාධාතු රූපය කාම ධාතුව නියෝජනය වෙන්නේ ම. වී ටිකක් පැලවෙන්නේ නැහැ නේ කළු ගලක් උඩ දැම්මාට. වී ටික පැලවෙන්නේ කොහෙද? මඩ සහිත බිමක. ඒ වගේ කාමය පැලවෙන්නේ නැහැ හැම තැනකම. කාමය පැලවෙන්නේ පඨවි, ආපෝ, තේජෝ, වායෝ කියන සතරමහාධාතු රූපයක් ඇසුරු කරගෙන ම විතරයි.

එතකොට මේ සතරමහාධාතු රූපයත්, ඒ රූපය අරබයා කෙනා කෙනාගේ මනසේ තියෙන වටිනාකම් සහ කෝණ - පුද්ගලයින්, සත්ත්වයින්, දේවල් කියන අදහසුත්, ඒවා එක්ක තියෙන වටිනාකමුත් මනසේ තියෙන, ඒ ටිකත්, සතරමහාධාතු රූපයත් කියන දෙක ම එකට එකතු වුණාම - ඒකයි තණ්හා, උපාදාන, භව - භව පච්චයා ජාති කියලා පෙන්නන්නේ. ඒ ගති දෙක ම එකට එකතු වුණාම නිර්මාණය වෙනවා ලෝකය. තමන්ගේ, පුද්ගලයින්ගේ, සත්ත්වයින්ගේ ඉපදීම වෙන්නේ එහෙම යි.

බැරිවෙලා මනසේ එහෙම ගති තිබුණත් සතරමහාධාතු රූපය නැත්නම්, ඒත් ඉපදීමක් වෙන්නේ නැහැ. මනසේ තියෙන ගතියට පවතින්නත් බැහැ. සතරමහාධාතු රූපය තියෙද්දී මනසේ වටිනාකමයි, ඒ රූපය අරබයා නොයෙක් විදියේ කෝණයි නැති වුණොත්, ඒත් පුද්ගලයින්ගේ, දේවල් වල ඉපදීමක් වෙන්නේ නැහැ. මේ ඉපදීම වෙන්න විඤ්ඤාණය රූපයකට බැසගන්න ම ඕන.

පන්දහ කියන ගතිය තමයි කර්ම විඤ්ඤාණය වෙන්නේ. ඇස් ඉදිරිපිටට එන රූපය තමයි, පෙනෙන රූපය තමයි සතරමහාධාතු රූපය. ඔය හිතේ තියෙන ගති ටික, නැත්නම් විඤ්ඤාණය රූපයකට බැස ගත්තහම තමයි ජාති. අර හිතේ තියෙන ගති ටික ඇස් ඉදිරි පිටට එන රූපයට තැබුවහම වෙන්නේ මොකක් ද? කඩදාසියෙන් පන්දහක් උපදිනවා. ඒ වගේ මේ රූප ටික සත්ත්වයන්, පුද්ගලයන් කියන හැඟීමක් අපේ මනසේ තියෙයි. ඒකට සතරමහාධාතු රූපය ප්‍රත්‍යය වුණහම, භවය ප්‍රත්‍යය වුණහම අපට වෙනවා ජාතිය. තමන්ගේ, පුද්ගලයන්ගේ ඉපදීම වෙනවා. උපන්න

කෙනාට නො මැරී ඉන්න බැහැ ම යි. උපන්න කෙනාට ලෙඩ නොවී ඉන්න බැහැ ම යි. උපන්න කෙනා ලෙඩ වෙනවා ම යි. උපන්න කෙනා මහළු වෙනවා ම යි. මරණයට පත් වෙනවා ම යි.

ඒ නිසා ***ජාති නිරොධො*** - යම් තැනක ඉපදීම නැත්නම්, තමන්ගේ ඉපදීම නැත්නම්, මේ 'මම යි' කියලා තමන්ට හිතාගන්න පුළුවන්කම නැත්නම්, මේ අනිත් සත්ත්වයන්, පුද්ගලයන් කියන හැඟීම උපදින්නේ නැත්නම්, මේ රන් රිදී, මුතු මැණික් කියන ගතිය උපදින්නේ නැත්නම්, අජරාමර යි. ජරා මරණයට පත් වෙන්න දෙයක් නැහැ. මහළු වෙන්න කෙනෙක් ඉන්නවා ද? කෙනා නැත්නම්? ලෙඩ වෙන්න කෙනෙක් ඉන්නවා ද? දූන් අපට කියන්න වෙන්නේ අම්මා ලෙඩවෙලා, සීයා ලෙඩවෙලා, ආච්චි ලෙඩවෙලා, පුතා ලෙඩවෙලා, දුව ලෙඩවෙලා නේ තියෙන්නේ, නේ? හරි. අපි අහමු - පඨවි ධාතුව ද පුතා? ආපො ධාතුව ද පුතා? තෙජො ධාතුව ද පුතා? වායො ධාතුව ද පුතා? අපි පුතා කියලා ඇඟිල්ල දික් කරන රූපයේ භෞතික නිර්මාණය ඔය සතරමහාධාතු ටික නේ ද? එහෙනම් ඒ සතරමහාධාතුව විපරිණාම වුණහම පුතා මළ දුක විඳින්නේ ඇයි අපි? මොකක් නිසා ද? පුතෙක්ව උපදවා ගත්ත එකේ දෝෂය. අපි දන්නේ නැහැ මේ හදගත්තේ දුකයි කියන එක.

එතකොට එයා දන්නවා දරුවන් ලෙඩ වෙලා, මහළු වෙලා, මැරිලා, නැත්නම් මොනවා හරි දෙයකින් දරුවන් නිසා එන දුක නො වෙන්න නම්, නෑදෑයින්, සහෝදරයින් නිසා එන දුක් නො වෙන්න නම්, තමන් නිසා එන දුක් නො වෙන්න නම්, දේපළ වස්තුව නැතිවීමෙන් වෙනස්වීමෙන් එන දුක් නො වෙන්න නම්, මොකක් ද වෙන්න ඕන? ජාතිය නැතිවෙන්න ඕන. කාගෙ ද? තමන්ගේ ඉපදීම වෙලා නැතිවෙන්න ඕන. අනිත් සත්ත්වයන්ගේ, පුද්ගලයන්ගේ ඉපදීම නැතිවෙන්න ඕන. වස්තූන්ගේ ඉපදීම නැතිවෙන්න ඕන.

මේ ශාසනයේ ජාතිය අනිත් අයට වඩා වෙනස්. ආර්ය භාෂාවක් කියලා කිව්වේ ඒකයි මම. පුළුවන් නම් තේරුම් ගන්න.

ජාති නිරෝධය කියලා කියන්නේ මේ පුද්ගලභාවයේ නො ඉපදීම. ඒක වෙන්න පුළුවන් - අපි දැක්කා ජාතිය ඇතිවෙන්නේ ක්‍රම දෙකකින් නේ. ස්කන්ධ යි, කෙලෙසු යි දෙක ම එකට එකතුවෙලා, තණ්හා උපාදාන කියන ටික භවයට ප්‍රත්‍යය වුණොත් නේ ජාතිය වෙන්නේ. එහෙනම් ජාතිය නැති කරන්නත් ක්‍රම දෙකක් තියෙයි. මොකක් ද? ස්කන්ධ ටික නැති වුණත් ඉපදීම නැති වෙනවා. කෙලෙස් ටික නැති වුණත් ඉපදීම නැති වෙනවා. ඒ කියන්නේ පුද්ගලයෙක්, දරුවා කියන හැඟීම නැති වුණත් කෙනෙක් උපදින්නේ නැහැ. දරුවා හොඳයි කියන කැමැත්ත තියෙනවා. නමුත් සතරමහාධාතු රූපය නැති වුණොත්? ඒත් ඉපදෙන්නේ නැහැ. වෙනසක් තියෙනවා හැබැයි. දරුවා හරි හොඳයි කියන හැඟීම තියෙනවා. සතරමහාධාතු රූපය විතරක් නැති වුණොත් කෙලෙස් ටික තියෙද්දී රූපය නැති වුණහම මැරුණා කියලා කියනවා. රූපය තියෙද්දී කෙලෙස් ටික නැති වුණොත්? නිවුණා කියනවා. නූපදිනවා. වෙනස එච්චර යි.

තාත්තා කියලා මට සිහි කරන්න පුළුවන්. සිහි කරන කොට මේ ගති ටික ඔක්කෝම තියෙයි. නමුත් මේ ගති ටික ජාතිය ඇති කරන්න ඇත්තට ම ඉන්න කෙනෙක්, ජීවත්වෙන කෙනෙක්, උපන්න කෙනෙක් කරන්න නම්, මට අවශ්‍ය යි මේ ගති ටිකට සතරමහාධාතු රූප මිටියක්. නැති වුණොත් උපන්න කෙනෙක් වෙනවා ද? නැහැ. හොඳයි, උපන්න කෙනෙක් නො වෙන්න නම්, ඉපදීම නැති කරන්න නම් ක්‍රම දෙකක් තියෙයි. මේ හිතේ ගතිය තියෙද් දී ම රූපය නැති වුණොත් ඉපදීම නැති වෙනවා. හැබැයි ඒ ඉපදීම නැති වීමට මරණය කියලා කියනවා.

ඔය ඉපදීම නැති කරන්න තවත් ක්‍රමයක් තියෙනවා. රූප මිටිය එහෙම ම තියෙද්දී, ඒ රූපය අරබයා වැරදි දෘෂ්ටිය, කෙලේසය අයින් කරගත හැකි යි. තාත්තා, තාත්තා හොඳයි කියන හැඟීම අයින් කරලා මේ පඨවිය පඨවිය නේ ද කියලා බැලුවොත්, ඒත් කෙනෙක් නිර්මාණය වෙන්නේ නැහැ.

රූපය පිරිසිඳ දැකලා ඒ රූපය කෙනෙක් කියන දැක්ම සහ ඒකට තියෙන ඇලීම නැති කළහම ඒකට කියනවා 'නිවුණා' කියලා. පුද්ගලභාවය නිවුණා. නිරුද්ධ වුණා. ඉපදීම නැති කළා වෙනවා. කෙනෙක්ගේ ඉපදීම නැති කළා වෙනවා.

ඒකයි ***පඨවිං පඨවිතො දිස්වා පඨවිස්මිං නිබ්බින්ධති*** කියලා කියන්නේ - මෙන්න මේ චතුරාර්‍ය සත්‍යය දන්නා ශ්‍රැතවත් ආර්‍ය ශ්‍රාවකයා ***ජාතිපි දුක්ඛා, ජරාපි දුක්ඛා, ව්‍යාධිපි දුක්ඛා, මරණම්පි දුක්ඛං, අප්පියෙහි සම්පයොගොපි දුක්ඛො, පියෙහි විප්පයොගොපි දුක්ඛො, යම්පිච්ඡං න ලභති තම්පි දුක්ඛං, සංඛිත්තෙන පඤ්චුපාදනක්ඛන්ධා දුක්ඛා*** - ඉපදීමෙන් පටන් අරගෙන කෙටියෙන් කියනවා නම් පංචඋපාදනස්කන්ධය - පුද්ගලයෙක් නිර්මාණය කරගත්ත ස්කන්ධ ටික ම දුකක්. දැන් මේ පුද්ගලයෙක් නිර්මාණය කරගත්ත ස්කන්ධ ටික අර සතරමහාධාතු රූපයට අයිතිත් නැහැ. ඒකයි මෙතන තියෙන ප්‍රශ්නය. මේ හිතේ තියෙන පුද්ගලයෙක්, තාත්තා කියන හැඟීම් ටිකට අයිතිත් නැහැ.

අපට පෙනෙන චිත්‍රපටය තිරයට අයිතිත් නැහැ නේ? එහෙනම් නෙගටිව් එකේ රූ සටහන අරගෙන එන ආලෝක කිරණ වලට අයිති ද? ඒ ආලෝක කිරණ ද අපට පෙනෙන රූපය? නැහැ. මේ දෙකමත් නෙවෙයි. මේ දෙකෙන් බැහැරත් නෙවෙයි. නමුත් මේ දෙක එකට එකතු වුණහම, ආලෝක කිරණ යි, තිරය යි කියන දෙකම එකට එකතු වුණහම ඒ දෙකටම අයිති නැති එකක් අපට නිර්මාණය වෙයි. රූපයක් පෙනෙයි.

ඒ වගේ තණ්හා උපාදන කියන ගති ටික සතරමහාධාතු රූපයට පතිත වුණහම අපට අම්මාගේ රූපයක්, තාත්තාගේ රූපයක් හම්බවෙයි. මෙන්න මේ රූපයට යි පංචඋපාදනස්කන්ධයේ රූප ස්කන්ධය කියලා කියන්නේ. ඒක දුක ම යි. මොකද ජාතිය ස්වභාව කොට ඇති ධර්මයක් ම යි.

එතකොට ශ්‍රැතවත් ආර්‍ය ශ්‍රාවකයා දන්නවා ජාතිපි දුක්ඛා - ඉපදීම දුකක් ම යි. තමන්ගෙත්, අනෙක් අයගෙත්, මේ දේවල් හැම එකක ම ඉපදීම දුකක් ම යි කියලා එයා දන්නවා. දුකට හේතුව තණ්හා,

උපාදාන, භව කියන මෙන්න මේ හේතු ටික, වර්තමාන හේතු ටික යි කියලාත් දන්නවා. එතකොට හොඳට දකින්න පුද්ගලභාවයත් මනසෙ යි. කැමැත්තත් මනසෙ යි කියන එකයි තණ්හා, උපාදාන කියන එකෙන් කියන්නේ. ඒ කියන්නේ සත්ත්වයෙක් කියන හැඟීමට තමයි අත්තවාද උපාදානය කියන්නේ. ආත්මයක් කියන හැඟීමට තමයි දිට්ඨි උපාදානය කියලා කියන්නේ. රන් රිදී කියන බඩුමුට්ටු, කාර් වාහන කියන හැඟීමට තමයි කාම උපාදානය කියන්නේ. මේ සතර උපාදානය නම් කරන්නේ ඒ තණ්හාව යෙදෙන්න තියෙන නිමිති. ඔය තණ්හා, උපාදාන කියන ගති ටික සතරමහාධාතුවට තබපු නිසා යි මේ උපන්නේ කියලාත් දන්නවා.

ඊට පස්සේ ජාති නිරෝධය - මේ ජරා මරණ දුක් නො එන්න නම් ඉපදීම නැති කළ යුතුයි කියලා දන්නවා. තමන්ගේ, අනිත් අයගේ, මේ හැම දෙයක ම ඉපදීම නැති වෙනවා. ඉපදීම නැති වෙන්න නම් මොකක් ද වෙන්න ඕන? භවය නැතිවෙන්න ඕන. සතරමහාධාතු රූපය ඇසුරු කරන මට්ටමෙන් මිදෙන්න ඕන. කෙනෙක්, පුද්ගලයෙක් කියලා ඇසුරු කරන ගතියෙන් මිදෙන්න ඕන. ඒක වෙන්න නම් තණ්හා, උපාදාන කියන මේ හිතේ තියෙන ගතිය අයින් කරන්න වෙනවා. මේ කෙලෙස් ටික සතරමහාධාතු රූපයට පතිත නො වුණොත් කෙනා නිර්මාණය වෙන්නේ නැහැ. දුක නිරුද්ධ වෙනවා කියලා නිරෝධයත් දන්නවා. ඔන්න දැන් එයා දුකත් දන්නවා, දුක ඇති වෙච්ච හැටිත් දන්නවා, ඒ ඇති වෙච්ච ක්‍රමය නැති කළහම දුක නිරුද්ධ වෙනවා කියලාත් දන්නවා.

ඊට පස්සේ දුක්ඛ නිරෝධගාමිනී ප්‍රතිපදාව - කියලා කියන්නේ මොකක් ද? සම්මා දිට්ඨිය. රූපයේ සැබෑ ස්වභාවය, සැබෑ ස්වභාවයෙන් ම පෙන්නනවා. ඇත්ත ඇතිහැටියේ පෙන්නනවා. එච්චර ම යි කරන්නේ. රූපයේ ඇත්ත ඇතිහැටියේ මොකක් ද? ***ඉමමෙව කායං යථාඨිථං යථාපණිහිතං ධාතුසො පච්චවෙක්ඛති*** - මේ කය යම්සේ පවතියි ද, යම්සේ පිහිටා පවතියි ද, එසේ ඇත්ත ඇතිහැටියේ සිහි කරනවා. ***අත්ථි ඉමස්මිං කායෙ පඨවීධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතු.***

තව පැත්තකින් ගත්තොත් අපට හිතන්න පුළුවන් නේ ක්‍රමය දැනගත්තොත් මේ රූප ටික අශ්ව රූප වුණේ, ඇත් රූප වුණේ, ස්ත්‍රී රූප වුණේ, මනුෂ්‍ය රූප වුණේ මේ විදියට යි.

රූපයේ ස්වභාවය හුඹහක් කොටලා ගත්ත මැටි ටිකෙන් හැදුණු හැඩ ටික, ඔය හැඩ ටික ස්ත්‍රී රූප, පුරුෂ රූප වුණේ හදගත්තේ මෙන්න මෙහෙම යි කියලා ක්‍රමය අපි දන්නවා නම්, අපි දන්නවා මැටි ටික මැටි විදියට බැලුවොත්, මේ මැටි අවකාශ ධාතුව තුළ රාශිවෙලා තියෙන හැඩ කියලා බැලුවොත් ස්ත්‍රී රූප, පුරුෂ රූප, අශ්ව රූප, ගව රූප පෙනෙයි ද අපට? නැහැ. මැටි ටික කැඩුණු දවසට ස්ත්‍රී රූපය කැඩුණා, පුරුෂ රූපය කැඩුණා, මැටි රූපය කැඩුණා කියන දුක එයි ද? නැහැ.

ඒ වගේ එක දෙයයි එයාට කරන්න තියෙන්නේ. සවිඤ්ඤාණක, අවිඤ්ඤාණක සියලු ම රූප පඨවි ධාතුයි. එකම පඨවි සඤ්ඤාව වඩන්න පුළුවන් නම්. අපි නිකමට කියමු මේ හැම දෙයක් ම එයා දකින්නේ අවකාශ ධාතුව තුළ රාශිවෙලා තියෙන සතරමහාධාතුව හැටියට යි. කාමය පරිභෝජනය කරන්න යන්න දෙන්නේ නැහැ. අපි කියමු දරුවා කියලා සිහිවෙන කොට තමන් හොඳටම දන්නවා මේ දරුවා කියන ගතිය සතරමහාධාතු රූපයට තැබුවොත් තියෙන දෝෂය දන්නවා - මොකක් ද? ඒ රූපය කෙනෙක් කියන ගතිය නිර්මාණය වෙනවා. කෙනෙක්ව උපදිනවා. රූපය කැඩුණු, බිඳුණු දවසට මොකද වෙන්නේ එතකොට? දරුවා මැරිච්ච දුක විඳින්න වෙයි කියලා දුකත් දන්නවා. මම දරුවා කියන මේ ගතිය සතරමහාධාතු රූපය ඇසුරු වෙන්න දෙන්නේ නැහැ කියන තැනකින් ඇසුරු වෙන්න දුන්නේ නැත්නම් ඒ රූපය කෙනෙක් කියන ගතිය උපදින්නේ නැහැ. එහෙම වුණොත් දරුවා නිසා එන සියලු දුකෙන් මිදෙනවා කියලා දන්නවා. දන්න නිසා දරුවා කියලා සිහිවෙන කොට හිත නැඹුරු වෙනවා නම් දරුවා කියලා රූපයකට, ඒ රූපය ගාවට ක්ෂණිකව නුවණ ගෙනිහිල්ලා ඒ රූපයේ ඇත්ත පෙන්නනවා, 'නැහැ, එතන තියෙන්නේ සතරමහාධාතු නේ' කියලා. එහෙම කිව්වාට හිත පිළිගන්නේ නැහැ. 'නෑ, දරුවා ඉන්නවා ම නේ' කියලා හිතෙනවා. ඊට පස්සේ

'හොඳයි, ඉන්නවා නම් දරුවා ගාවට ගිහිල්ලා මම ඇල්ලුවොත්, පරිභෝජනය කරන්න යනවා. අතින් ඇල්ලුවා. හරි. අත කියන්නේ, අහුවෙන්නේ හම, ඒ කියන්නේ පඨවි ධාතුව. මස් කියන්නේ පඨවි ධාතුව. නහර කියන්නේ පඨවි ධාතුව. හොඳයි, දරුවා ඉන්නවා නම් ඉන්න දරුවා අල්ලන්න කො ගිහිල්ලා. තමන් ම කියනවා. ඇල්ලුවොත් - ඔළුවෙන් ඇල්ලුවොත් එතන කෙස්, අහුවෙයි පඨවි ධාතුව. අල්ලන, අල්ලන තැන ඒ රූපයේ දැන් තමන්ට අහුවුණේ මෙතන, දැන් අහුවුණේ මෙතන, කෝ අහුවුණා ද දරුවා? කියලා තමන්ගෙන් ම අහන විදියට පෙන්නනවා.

එහෙම ඔප්පු කරන්න බැරි වුණොත්, බැරිවෙන හැම වෙලාවක ම මේ හිතේ ගතිය අර රූපයට පෙන්නලා ඒ රූපය කෙනෙක් ම කරනවා. පුද්ගලභාවය උපද්දලා, දුක ගෙනත් දෙනවා ම යි. අර විදියට 'නෑ, දරුවා කියන හැඟීම තිබුණාට එතන තියෙන්නේ සතරමහාධාතු නේ' කියලා බලනවා. බැලුවාට අපි දක්ෂ නැහැ ඉන්ද්‍රිය වැඩිලා නැති නම් හිත පිළිගන්නේ නැහැ. 'නැහැ, දරුවා ම තමයි ඒ රූපය' කියලා පෙන්නනවා. හිතට පෙන්නනවා හිතෙන්.

ඒ වෙලාවේ දී තමන් ඒ රූපය පරිභෝජනයට ගිහිල්ලා, 'හොඳයි දරුවා ඇසුරු කරන්න යන්න එහෙනම්' කියන තැනට ගිහිල්ලා ඒ රූපය ඇල්ලුවොත් දරුවා කියලා කොතන ද ඇල්ලුවේ? අල්ලන, අල්ලන තැන පෙන්නනවා කොහොම ද? 'ආ, මෙතන පඨවි, මෙතන ආපො'. එතකොට අර දරුවා කියන අදහසට ඒ රූපයට බැසගන්න ඉඩ නැහැ. තේරුණා නේ ද?

ඊට පස්සේ අපි කියමු කාර් එක කියලා සිහි කරන්න පුළුවන්. සිහි කරනවාත් එක්කම පෙන්නන හැඩතලය ගත්තොත් 'නෑ, ඒ සතරමහාධාතු රූපයේ හැඩය නේ' කියලා පෙන්නනවා. මොකද එහෙම පෙන්නන්න බැරි වෙන කොට කාර් එක කියන හැඟීමත්, හැඟීමේ තියෙන වටිනාකමත් සතරමහාධාතු රූප මිටියට තැබුවහම ඒ සතරමහාධාතු හැඩය කාර් එකක් ම වෙනවා. වාහනයක් ම වෙනවා. එයාට එච්චර ඒක වටිනවාත් වෙනවා.

ඊට පස්සේ ඒ සතරමහාධාතු රූප මිටිය කුඩුවෙච්ච, හැප්පිච්ච, තැලිච්ච දවසට මෙච්චර වටින වාහනය කැඩුණා නේ කියන තැනකින් දුක් විඳින්න වෙනවා. ඒකයි තියෙන දෝෂය. වාහනය පරිහරණය කළාට ප්‍රශ්නයක් නැහැ. ආශ්වාදයක් නැතුවා නෙවෙයි. කාර් එකේ යන්න පුළුවන්, වාහනයේ යන්න පුළුවන්, ජීප් එකේ යන්න පුළුවන්. ආශ්වාදයක් නැතුවා නෙවෙයි. ආදීනව බොහෝ යි. දුක් විඳින්න වෙයි. දරුවා හදාගත්තාට කමක් නැහැ. දරුවාගේ මූණ බලලා සතුටු වුණාට කමක් නැහැ. අම්මලා, තාත්තලා ඇසුරු කළාට කමක් නැහැ. ආශ්වාදයක් නැතුවා නෙවෙයි. තියෙයි, පුළුවන්. ආදීනව බොහෝ යි. ඒකාන්තයෙන් ඒ ආශ්වාදය තුළ දුක ගැබ්වෙලා තියෙනවා. දුක යෙදිලා තියෙනවා. ඒ ආශ්වාදය විඳිනවා නම් ඒ එක්කම තියෙන මහා විශාල දුකක් විඳින්නත් බලාගෙන ම ආශ්වාදය විඳින්න. දරුවාගේ මූණ බලලා සතුටු වෙන්න පුළුවන්. සතරමහාධාතු රූප මිටිය දරුවා කියන හැඟීම ආරෝපණය කරගෙන ඒ දිහා බැලුවහම මට පෙනෙන්නේ දරුවෙක් ම යි, දරුවා දිහා බලලා බොහෝම සතුටු වුණ හැකියි මට. දරුවාගේ මූණ බලලා සතුටු වෙන්න පුළුවන්, කටහඬ අහලා සතුටු වෙන්න පුළුවන්, ඉඹලා සතුටු වෙන්න පුළුවන්, වඩාගෙන සතුටු වෙන්න පුළුවන්. පංච කාමයන් ම තියෙයි.

ඒ වගේ ම යි ආදීනවය. ඔය දරුවා හෙට දවසේ දී වාහනයකට හැප්පිලා චප්පවෙලා, කුඩුවෙලා, පොඩිවෙලා මැරෙන්න පුළුවන්. පිළිකාවක් හැදිලා මැරෙන්න පුළුවන්. හොඳ කරන්න බැරි රෝගයක් හැදෙන්න පුළුවන්. දරුවාට නෙවෙයි රූපයට වෙන්න පුළුවන් ඒක. හැබැයි එදාටත් දරුවාට මෙහෙම වුණා කියන තැනකින් විඳින්න බලාගෙන කරන්න. දරුවාගෙන් සතුටු වෙන්න වෙන දෙය දරුවාගෙන් විඳින්න බලාගෙන. ඔබට දරුවාගෙන් එන දුක විඳින්න අපහසු නම්, දරුවා නිසා එන සතුටත් නූපදවන්න වෙනවා. තේරුණා ද මම මේ කියන එක?

ඒ වගේ තමනුත් එහෙම යි. මේ තමන් ඉන්නවා. මම මෙහෙම කෙනෙක්, මෙච්චර මෙච්චර දේවල් තියෙන කෙනෙක්, මෙහෙම මෙහෙම කරන්න පුළුවන් කෙනෙක්, මෙහෙම මෙහෙම දයකයින්

ඉන්නවා, නැත්නම් මෙහෙම හැකියාවන් තියෙනවා කියලා තමන්ගෙන් තමන් ගැන සතුටු වෙන්න. හැබැයි ඊ ගාව මොහොතේ දී තමන්ට එන නින්ද අපහාස, ඇනුම් බැණුම්, තාඩන පීඩන, බඩගින්න, පිපාසාවල් ටිකත් මට විඳින්න බලාගෙන තමන්ව පරිහරණය කරගන්න. ඒ දුක් තමන්ට එපා නම් මට දුවෙක් ඉන්නවා, පුතෙක් ඉන්නවා, නෑදෑයින් ඉන්නවා, ඥාතීන් ඉන්නවා කියලා තමන්ගෙන් එන ආශ්වාදයත් අතහැර ගන්න වෙනවා. මම මෙහෙම කෙනෙක්, මෙහෙම රස්සාවක් තියෙ යි, මෙච්චර ඉගෙනුමක් තියෙ යි, මෙච්චර දැනුමක් තියෙ යි, මට මේ දරුවන් ඉන්නවා, ගෙවල් තියෙනවා, නෑදෑයින් ඉන්නවා, මෙහෙම ඉන්නවා කියලා මේ තමන්ව උපදවාගෙන, තමන්ගෙන් තමන්ට සතුටු වෙන්න පුළුවන්. ආශ්වාදයක් නැතුව නෙවෙයි තියෙයි. ඔය ආශ්වාදය තුළ නින්ද-අපහාස-ඇනුම්-බැනුම්-තාඩන-පීඩන කෙළවරක් නැති දුකක්. ඒ විතරක් නෙවෙයි මරණයෙන් පස්සේ සතර අපා දුකත් අයිති යි. ඒකයි බුදුරජාණන්වහන්සේ දේශනා කළේ ආශ්වාදය ටිකයි, ආදීනව බොහෝ යි. ඒ නිසා කැමැති වෙන්න ඕන මොකකට ද? ජාති නිරෝධයට, අජරාමර බවට. ජරා මරණ නැති කම ම, අජරාමර බව ම, සැපක්. අජරාමර වෙන්නේ නූපදින කෙනාට යි. නො හටගන්නා කමට යි. තමන්ව හෝ අනිත් අයව. ඒක කරන්න පුළුවන් කාම භූමියේ සතරමහාධාතු රූපය පිරිසිඳ දැකලා ඒ රූප අරබයා තමන්, පුද්ගලයින්, සත්ත්වයින්, කියන කැමති සහ මනසේ තියෙන මිම් ගෙවලා දලා ඉපදීම නැතිකර ගත හැකි යි. දුකෙන් මිදිය හැකි යි.

ඒ නිසා කායගතාසතිය, කායානුපස්සනාව, නැත්නම් පංචඋපාදානස්කන්ධයන්ගේ උදය වැය - ***ඉති රූපං ඉති රූපස්සසමුදයො ඉති රූපස්ස අත්ථඞ්ගමො*** - මේ මාර්ගය. මේ රූපයේ කෙස් ලොම් නිය දත් සම් මස් කුණප කොටස් තිස්දෙකක් නේ ද තියෙන්නේ, කන බොන ආහාරයෙන් හැදෙනවා නේ ද කියලා බලනවා. බලන කමට චතුරාර්‍ය්‍ය සත්‍යය අවබෝධ වෙනවා. ඔච්චරයි බලන්නේ. ඇයි ඒ? එයා මෙහෙම බලන්නේ ඇයි? බලන්නේ චතුරාර්‍ය්‍ය සත්‍යයේ නුවණ තියෙන හින්ද යි. මෙහෙම බලන්න අමතක වෙන හැම වෙලාවක ම මම කියන, තණ්හා

උපාදන කියන ගතිය මේ රූපය මත පතිත වෙලා, මාව නිර්මාණය කරලා දුක ගෙනැත් දෙනවා නේ ද කියලා දුක යි දුක්ඛ සමුදයත් දන්නවා. මේ රූපයේ ඇත්ත ඇති හැටියේ බල බලා ඉන්න කොට මම කියන ගතිය මේ රූපය මත පතිත වෙන්නෙ නෑ. එහෙම වුණොත් මාව නිර්මාණය වෙන්නේ නැහැ. එහෙම වුණොත් මට නින්ද-අපහාස-ඇනුම්-බැනුම් අහන්න වෙන සියළු දුකෙන් නිදහස් වෙනවා නේ ද කියලා නිරෝධයටත් නුවණ තියෙන හින්ද යි මෙයා මේ රූපයේ ඇත්තත්, ඒකට හේතු ටිකත් - ඇතිවීමත් නැතිවීමත් බලන්නේ. අර නුවණ පිටිපස්සේ වෙනම තියාගත්තහම රූපයත්, කන බොන ආහාරයෙන් රූපය ඇතිවෙනවා නැතිවෙනවා බලන්න විතරම ම යි ඕන. එහෙම නැත්නම් මේ හැම රූපයක් මත් සතරමහාධාතු නේ. මේ හැම රූපයක් ම සතරමහාධාතු නේ ද, සතරමහාධාතුව අවකාශධාතුව තුළ රාශි වෙලා තියෙන හැඩ නේ ද, කියලා විතරයි හිතන්නේ. ඒ හිතනකමට ආශ්‍රවක්ෂය වෙනවා. චතුරාර්‍ය්‍ය සත්‍යය අවබෝධ වෙනවා. එච්චරයි හිතන්නේ.

ඇයි ඒ? එයා දන්නවා මම මෙහෙම හිතන්නේ මෙහෙම හිතන්න බැරිවෙන හැම වෙලාවක ම හිතේ තියෙන ගති, අත්තවාද උපාදනය මේ මත පතිතවෙලා පුද්ගලයින්, සත්ත්වයින් කියන ගතිය සතරමහාධාතුව මත පතිත වෙලා තව සත්ත්වයෙක් පුද්ගලයෙක් උපදිනවා නේ ද, දුක උපද්දනවා නේ ද කියලාත් දන්නවා. මම මේ විදියට බලන කොට මේ සිතේ තියෙන ගති ටික සතරමහාධාතුවට බැසගන්නේ නැහැ. එහෙම වුණොත් සත්ත්වයින් පුද්ගලයින් නිර්මාණය වෙන්නේ නෑ නේ ද කියලාත්, දුක උපදින්නේ නෑ නේ ද කියලාත් නුවණ යි. ඒ නිවනට නුවණ තියාගෙන, නිරෝධයට නුවණ තියෙන හින්ද යි මේ හැම රූපයක් ම සතරමහාධාතු යි කියලා බලන්නේ.

ඒ වගේ චතුරාර්‍ය්‍ය සත්‍යය ඉගෙනගන්නවා හොඳට. කෙනෙකුට ඔහොම විදර්ශනා කරන්නත් බැරි නම් වෙනම තව සමථ කමටහනක් වඩලා, හිත ටිකක් දියුණු වුණාට පස්සේ මේ රූපයට හිත තබනවා මේක සතරමහාධාතු යි කියලා. දැන් තවම බැලුවාට බලාගන්න බැරි නම්, දරුවා ම යි, මනුස්සයා ම යි කියලා නම්

පෙනෙන්නේ, අපි බොහෝ කාලයක් අපේ හිත ම උපාදනය කරලා යි තියෙන්නේ. ඒ වගේ ක්‍රම තියෙනවා.

ඉතින් මම මෙතැන දී මතක් කළේ බුදුරජාණන්වහන්සේ නිවන කියලා පෙන්නුවේ ඉපදීම නැති කරන එකට යි. මේ සතරමහාධාතු නැත්නම් මේ ස්කන්ධ ටික තියෙද්දී කෙලෙස් ටික නැතිකරලා සත්ත්ව-පුද්ගල භාවයෙන් එන සියලු දුකෙන් නිදහස් වෙච්චි තැනට කියනවා **අනුපදිසේස පරිනිර්වාණය** කියලා. රහතන්වහන්සේ කියලා කියන්නෙ සත්ත්ව-පුද්ගල භාවයෙන් එන විඳින සියලු දුක් නැති කරලා ස්කන්ධ ටික විතරක් පරිහරණය කරනවා. ස්කන්ධ ටික - දැන් අපි කියමු මේ රූපය සතරමහාධාතුයි කියන නුවණින් පරිහරණය කරනවා, 'මම' කියන හැඟීමේ අනුසය වත් නැහැ. මාන අනුශය ගෙවුනා කියලා කියන්නේ මේ රූපයේ 'මම' කියන හැඟීම ගෙවුණු දවසට අනාගාමි යි. එතකොට හිතේ 'මම' කියන හැඟීම එනවා. ඒකේ තියෙන නාමධර්ම ටිකේ 'මම' කියන හැඟීම ගෙවුණු දවසට මත්තේ කටයුත්තක් නෑ කියන තැනකට එනවා.

එතකොට මේ සත්ත්වයින් පුද්ගලයින් දේවල් කාරණා කියන හැඟීමක් නෑ රූපය පිරිසිඳ දැකපු දවසට. පඨවි ධාතුවේ, සතරමහාධාතුවේ නෑදෑයින් දකින්නේ නෑ එයා. සතරමහාධාතුවේ බඩුමුට්ටු දකින්නේ නෑ එයා. සතරමහාධාතුව සතරමහාධාතුව හැටියට විපරීත නො වූ මනසකින් දකිනවා. එහෙම දැකලා කෙලෙස් පිරිනිවීමෙන් පිරිනිවෙනවා කියන්නේ එයා මනුෂ්‍යයන්ට අයිති කෙනෙක් නෙවෙයි. මනුෂ්‍ය ලෝකයේ සංයෝජනයක් එයාට නැහැ. එයා දෙවියන්ට, බ්‍රහ්මයන්ට අයිති කෙනෙකුත් නෙවෙයි. බ්‍රහ්මයින් ගාව තියෙන සංයෝජනයකුත් එයාට නැහැ. එයා අරූපී බ්‍රහ්මයින්ට අයිති කෙනෙකුත් නෙවෙයි. ඒ නිසා තියෙන සංයෝජනයකුත් නැහැ. කාම ලෝකයේ ඉපදීම නැති කරලා, රූප ලෝකයේ ඉපදීම නැති කරලා, අරූප ලෝකයේ ඉපදීම නැති කරලා ස්කන්ධ ටික විතරක් පරිහරණය කරනවා. ඒකට කියනවා සෝපදිසේස නිබ්බානය කියලා. ස්කන්ධ ටික විතරක් තියෙද්දී පිරිනිවිලා. කෙලෙස් පිරිනිවීමෙන් පිරිනිවිලා. අජරාමර වෙලා. ජරාමරණයට පත්වෙන්නෙක් නෑ. ජරාමරණ දුකක් නෑ එයාට.

අජරාමරයි. අජරාමර නිවණ සෂාත් සෂාත් කරගත්තා ජීවත්ව ඉන්න ගමන්. නො ඉපදීම සෂාත් සෂාත් කරගත්තා ජීවත්ව ඉන්දෙද්දී ම. ඒ ස්කන්ධ ටික අවුරුදු පණහක් හරි, හැටක් හරි තියෙනකම් තිබිලා ඒකෙ ආයු සන්තතිය අතහැරුණු දවසට ඒ ස්කන්ධ ටිකත් නිරුද්ධ වෙලා යනවා. ප්‍රතිසන්ධියකට යන්නේ නැහැ. එතකොට කියනවා **අනුපදිසේස පරිනිර්වාණය** කියලා.

අනුපාද පරිනිර්වාන සහ අනුපදිසේස පරිනිර්වාන කියන්නේ දෙකක්. කිසිවක් උපාදාන වශයෙන් නො ගෙන මිදීමට කියනවා අනුපාද පරිනිර්වාන කියලා. නැතිනම් රහතන්වහන්සේ කියලා. ක්ලේශ පරිනිර්වානය. එතැනට විතරයි බුදුරජාණන්වහන්සේ ධර්ම දේශනාව කරන්නේ. හොඳට මතක තබාගන්න **අනුපාද පරිනිර්වානයට, ක්ලේශ පරිනිර්වානයට විතරයි බුදුරජාණන්වහන්සේ ධර්ම දේශනා කරලා තියෙන්නේ.** ස්කන්ධයන්ගේ පිරිනිවීම වෙනවා කියන එක ධර්මතාවයක් එතැනට ආපු කෙනාට. එතැනට බණ කියන්නේ නැහැ. බණ කියලා නැහැ. බුදුරජාණන්වහන්සේ චතුරාර්‍ය සත්‍යය දේශනා කළේ ජීවත්ව ඉද්දී සෂාත් සෂාත් කරගන්න මිසක මේ ස්කන්ධ ටික පරිහරණය කරද්දීම සෂාත් සෂාත් කරගන්න මිසක, මරණයෙන් පස්සේ ජාතිය නැති කරන එකක් නෙවෙයි. එහෙම එකක් නෑ ජාතියේ.

ජාතිය දෙආකාරයි. ***භව පච්චයා ජාති.*** සත්ත්ව-පුද්ගලයන්ගේ ඉපදීමකුත් තියෙනවා, ස්කන්ධයන්ගේ ඉපදීමකුත් තියෙනවා. ප්‍රතිසන්ධි වශයෙන් හටගත්තේ ***සංඛාර පච්චයා විඤ්ඤාණං, විඤ්ඤාණ පච්චයා නාමරූපං, නාමරූප පච්චයා සළායතනං, සළායතන පච්චයා ඵස්ස, ඵස්ස පච්චයා වෙදනා*** කියලා කියන්නේ ස්කන්ධයන්ගේ හටගැනීම යි. පුරාණ කර්මයට ස්කන්ධ ටික හටගන්නවා. ඒක ධර්මතාවයක්. කෙනෙක් නෙවෙයි, පුද්ගලයෙක් නෙවෙයි. දන් මේ මේසය කියන්නේ කෙනෙක් ද? පුද්ගලයෙක් ද? නෑ. හැබැයි මේකට වෙනසක් තියෙයි අනුපාදින්න යි. කර්ම ප්‍රත්‍යයෙන් නෙවෙයි. මේ කයත්, මේ භෞතික තත්ත්වය ම යි. මේ රූපයේ තියෙන භෞතික තත්ත්වයේ වෙනසක් තියෙයි. මේ රූපය කර්ම ප්‍රත්‍යයෙන්. තමන් කියන රූපය කර්ම ප්‍රත්‍යයෙන්. එච්චරයි.

ඒකට කියනවා උපාදින්න කියලා. මේ මේසය කියන එක අනුපාදින්න යි. භෞතික තත්ත්වය එකයි. මේක කර්ම ප්‍රත්‍යයෙන් නෙවෙයි, ඍතු ප්‍රත්‍යයෙන් රාශිවෙලා තියෙන්නේ මේසය කියන එක. මේ ශරීරය කන බොන ආහාරය, හිතේ තියෙන කර්ම ගතියට අනුව රාශිවෙලා තියෙන්නේ. අපි 'මම' කියලා හිතුවාට, ඔය දෙවෙනි අදියරයි මේ 'මම' කියලා හිතන එක.

ඔන්න ඔය වගේ ආයතන ටිකක්, ස්කන්ධ ටිකක් තමයි උපන්නේ. එතැන පුද්ගලයෙක් නෑ. දුක් විඳින සත්ත්වයෙක් නෑ. ධර්මතාවයක්. ස්පර්ශයෙන් වේදනාව ඇතිවෙනවා. ස්පර්ශය නැතිවෙන කොට නැතිවෙනවා. ස්පර්ශයෙනුත් හඳුනාගන්න පුළුවන්කම එනවා. ස්පර්ශය නැතිවෙනකොට හැඳිනීම නැතිවෙනවා. ආහාරය නිසා රූපය ඇතිවෙනවා. ආහාර නැතිවෙන කොට නැතිවෙනවා - මේක ධර්මතාවයක්.

එබඳු ආයතන ටික අරබයා පෙනෙන ඇහෙන තැන දක්වා ම ස්කන්ධයන්ගේ පැනැවීම ධර්මතාවයක්. ඒ ටිකට වර්තමානයේ ඇති කරගන්න තණ්හා උපාදානය කියන මේ ගති ටික අර ධර්මතාවයක් වූ ස්කන්ධ ටිකට ආපහු තැබුවොත් මොක ද වෙන්නේ? ඒකයි ***වෙදනා පච්චයා තණ්හා, තණ්හා පච්චයා උපාදනං, උපාදන පච්චයා භව*** කියලා කියන්නේ. අර ස්පර්ශ ආයතන පැත්තට ආයෙත් ඒ ගති ටිකෙන් ගිහිල්ලා. එතකොට නිර්මාණය වෙනවා පුද්ගලයා. කෙනා. අන්න ජාතිය. අන්න කෙනා ඉපදුනා.

මව් කුසයෙන් උපන්න තැන තියෙන්නේ බීජ පරම්පරාව, නැත්නම් ස්කන්ධයන්ගේ පැවැත්ම යි. ගහකින් තව ගෙඩියක් හැදෙනවා කියන එක, ඒ ගෙඩියෙන් ගහක් හැදෙනවා කියන එක බීජ පරම්පරාව යි. ඒ වගේ දෙමව්පියන් නිසා ශරීරය ඇතිවෙනවා. ඒ ශරීරයත් ඒ විදියට ම එහෙම යනවා කියන මේක බීජ පරම්පරාවක්. රූපවල හැටි යි ඒ. රූපයේ පැවැත්ම යි. එතකොට ඔන්න ස්පර්ශ ආයතන හයේ ඇතිවීම දක්වා ම ***පුරෙ කතස්ස කම්මස්ස ඉධ පටිසන්ධි පච්චයා*** පෙර කළා වූ කර්මය මේ උත්පත්ති භවයට. මේ ප්‍රතිසන්ධියට හේතු. මෙතැන සන්ධියක්. ඊට පස්සේ වර්තමානයේ

ඇතිකරගන්න පෙනෙන ඇහෙන දේ ඇත්ත නො දන්නාකම නිසා පෙනෙන ඇහෙන දේ නිමිති හදගෙන, ඒකට තණ්හා උපාදන වෙලා, පෙනෙන ඇහෙන පැත්තට ම තබන එකට තමයි අවිජ්ජා-සංඛාර-තණ්හා-උපාදන-භව කියලා කියන්නේ වර්තමාන හේතු ටික.

තිබ්බහම තියෙන දෝෂය මොකක් ද? ජාති යි. තමන් නිර්මාණය වෙලා, පුද්ගලයෙක් නිර්මාණය වෙලා, ලෝකය ඇත්තට ම හැදිලා. දැන් ඉන්නකම් තමන්ව ජීවත් කරවන්න, තමන්ගේ අය ජීවත් කරවන්න, වෙහෙසිලා, වෙහෙසිලා, වෙහෙසිලා, වෙහෙසිලා, වෙහෙසිලා දුක උපදවාගෙන, දුක නිවාගන්න. පෙට්‍රල් දලා, ගිනිකූරක් ගහලා, ගිනි තියාගෙන, ඊට පස්සේ මොක ද කරන්නේ? දැන් ඉතින් කොළ අතුත් කඩලා ගහගන්නවා නිවාගන්න, ගෝනිත් තෙමලා ගහගන්නවා නිවාගන්න, ඒත් නිවාගන්න බැහැ. මොකද? අර ගින්න සැර වැඩියි.

ඉතින් ඔහොම ඔහොම කර කර ඉඳලා පුද්ගලභාවය නිසා විඳින දුක් ටික මේ ජීවිතයෙන් ඉවරයි. ඒ පුද්ගලභාවය දුරු නො වුණු නිසා ම, ඒ අවිද්‍යාවෙන් ගත්ත නිමිත්ත ම මුල්කරගෙන නැවතත් ස්කන්ධ ටික හටගන්නවා වෙන තැනක. ආයෙත් ස්කන්ධ ටික හටගන්නවා. දැන් පුද්ගලයා නෙවෙයි. ඒකයි මේ ජීවිතයේ නෑදෑයින් ඊගාව ජීවිතයේ නෑදෑයින් නෙවෙයි. අද ඉන්න අම්මා-තාත්තා-සහෝදර-සහෝදරියන් ඊගාව ජීවිතයේ ඇයි එහෙම ම අය නො වෙන්නේ? ඊගාවට විඤ්ඤාණය බැස ගන්නේ වෙන තැනක රූපයකට නම්, එතන හැදෙන පරිසරයේ ස්කන්ධ ටික හැදුණහම ඒ ස්කන්ධ ටිකට ආපහු අලුතෙන් ම තණ්හා උපාදන වෙලා ස්කන්ධ ටිකට තිබ්බහම එතැන නෑදෑයින් ටික ආයෙ හැදෙනවා.

සත්ත්වයා භවයෙන් භවයට යන්නේ නැහැ. පටිච්චසමුප්පාද ධර්මතාවයක් නිසා ස්කන්ධ ටික ඉපදිලා ***තණ්හං ජනෙති පුරිසො*** - තණ්හාවෙන් පුරුෂභාවය, පුද්ගලභාවය ලෝකයේ උපද්දවාගන්නවා මිසක, උපද්දවාගෙන දුක් විඳිනවා. මේ ලෝකය මෙතැන ම අතහැරෙනවා.

ආයෙත් ස්කන්ධ ටිකේ ඇත්ත නො දන්නාකම නිසා තණ්හා උපාදානය ආයෙත් උපදින තැන ලෝකය හදාගන්නවා. හදාගෙන දුක් විඳිනවා එතැන ම. දුක ම උපදවනවා. දුක ම පවතිනවා. වෙන මොකුත් නැහැ. ආයෙත් ඒ දුක අවබෝධ නො වුණුකම නිසා, කෙලෙස් ටික දුරු නො වුණු නිසා, ආයෙත් ස්කන්ධය පහළවෙනවා. ***පටිච්චසමුප්පාද ධම්මෙසු ඤාණං.*** එතකොට එයා දන්නවා සත්ත්වයා මරණෙන් පස්සේ උපදිනවා ද? නෑ. ඇයි? ස්කන්ධ ටිකට දන් කෙලෙස් ටික හඳුගෙන දූන් නම් සත්ත්වයා කියන එක හදාගත්තේ, ආයෙත් මරණාසන්න මොහොතේ දී වෙන්නේ මොකක් ද? ස්කන්ධ ටික ප්‍රතිසන්ධි වශයෙන් - නැත්නම් විඤ්ඤාණය නිසා නාමරූප වෙනවා කියන ධර්මතාවයක් වෙනවා. කෙනෙක් උපදිනවා නෙවෙයි. මෙතැන තණ්හාව ස්කන්ධ ටිකට තබලා, පුද්ගලයා උපදවන එක නතර කරලා, අජරාමර වෙන එකට තමයි **සෝපදිසේස නිබ්බාන** කියලා කිව්වේ. ස්කන්ධයන් ප්‍රතිසන්ධි වශයෙන් නැත්නම් ස්කන්ධයන් නැවත ප්‍රතිසන්ධි වශයෙන් පැමිණෙන එක නතරවෙන එකට යි **අනුපදිසේස පරිනිර්වාන** කියලා කියන්නේ.

මේ නිවන දෙ ආකාරයකින් පැනෙව්වේ ජාතිය දෙ ආකාරයකින් වෙන නිස යි. ස්කන්ධයන්ගේ ඉපදීමත්, පුද්ගලයන්ගේ ඉපදීමත්. බුදුරජාණන්වහන්සේ ධර්ම දේශනා කළේ සත්ත්ව-පුද්ගලභාවය නො ඉපදීමට යි. ගුරු බර තියෙන්නේ ඒ ටිකට යි. වැඩි බර තියෙන්නේ ඒ ටිකට යි. ඒ කියන්නේ මේ කයට ගැටෙන දුකක් සමහර විට විඳින්න මේ ඇත්තන් කැමැති වෙයි. නමුත් මානසික දුක ඊට වඩා දුකක්. අපි කියමු : 'උඹට මේ පිහියෙන් එක සැරයක් අනින්න ද, උඹේ දරුවා ම උඹේ ඇස් දෙක ඉදිරිපිට කෑලි කෑලි කපලා මරන්න ද' කියලා ඇහුවොත් මොකට ද කැමැති වෙන්නේ? මේ මගේ කයට පිහියෙන් අනින්න කියන එකට කැමැති වෙනවා නේ ද? බලන්න කාය සම්ඵස්සයෙන් උපදින වේදනාව විතර යි. ඔය ඇත්තන්ට එබඳු වේදනාවක් උපදිනවා ද දරුවා කෑලි කෑලිවලට කපන කොට? නෑ. ඔය ඇත්තන් විඳින්නේ මනසෙන් නෙවෙයි ද? කෙලෙස් නිසා යි. ඒ කියන්නේ කෙලෙස් නිසා එන දුක, දුක වැඩියි, බර වැඩියි, කාය සම්ඵස්සයෙන්, ස්කන්ධයන්ගෙන් එන දුකට

වඩා. පිළිගන්නවා ද ඒක? ඒ නිසයි වැඩි බර, ගුරු බර බහා තබනවා කියන්නේ මේ කෙලෙස් නිසා එන දුකෙන් මිදෙන්නයි බුදුරජාණන්වහන්සේ පාර පෙන්නුවේ.

චතුරාර්‍යය සත්‍යය පෙන්නන්නේ එතෙන්ට යි. ***ජාති පි දුක්ඛා ජරා පි දුක්ඛා*** කියන කොට, ඉපදීම දුකක් කියන කොට හොඳට මතක ඇතුව, නුවණ ඇතුව තබාගන්න පින්වතුන්ව උපදවාගත්ත, මාව උපදවාගත්ත, පින්වතුන්වයි මාවයි උපදවාගත්ත මේ ලෝකයට යි කිව්වේ. මෙහෙම හම්බවෙන මේ ලෝකයට යි ඉපදීම කියලා කිව්වේ. මේක වුණේ කෙලෙස් ටිකයි, ස්කන්ධ ටිකයි, දෙක ම එකට එකතුවෙලා, ස්කන්ධයි කෙලෙසුයි අතර තියෙන සම්බන්ධතාවය එක් කෙනෙක් හෝ නැති වුණොත් මේ ඇත්තන්ගෙයි මගෙයි ලෝකය ඇත්ත වෙන්නේ නැහැ. ඒකට කෙලෙස් ටික නැතුව ස්කන්ධ ටික නැති වුණොත් ජීවිතෙන්ද්‍රිය පවතින්නේ නැහැ. රූප ජීවිතින්ද්‍රිය, නාම ජීවිතින්ද්‍රිය පවතින්නේ නැහැ. ඒ කියන්නේ ජීවත්වෙන්න බැහැ. ඒ කියන්නේ මැරෙනවා. රහතන්වහන්සේ නමක් කියලාවත් ලෝකයේ ධර්‍මයක්වත් කියන්න කෙනෙක් ඉන්නේ නැහැ.

රූප ටික තියෙද්දී, ස්කන්ධ ටික තියෙද්දී, නාමරූප දෙක තියෙද්දී කෙලෙස් ටික නැති කළොත්, ඒත් පින්වතුන්ගෙත් මගෙත් ඉපදීම නැහැ. මෙහෙම නෑ. මේ මම වෙන්නේ නෑ. මේ ඔය ඇත්තන් වෙන්නේ නැහැ. මේ ඇත්තනු යි, මම යි වෙන්නේ නැහැ. පෙනෙනවා නම් යමක්, පෙනෙන දේ එක්ක ඔය ඇත්තන් නැහැ. ඔය ඇත්තන් එක්ක පෙනෙන දේ නැහැ. පෙනෙන දේ තුළ ඔය ඇත්තන් නැහැ. ඔය ඇත්තන් තුළ පෙනෙන දේ නැහැ. පෙනෙන දේ එක්ක ඔය ඇත්තන් නැතිවෙන කොට, පින්වතුන් එක්ක පෙනෙන දේ නැතිවෙන කොට, පින්වතුන් මෙලොවට අයිති කෙනෙක් නො වේ වෙනවා. පින්වතුන් පරලොවට අයිති කෙනෙකුත් නො වේ වෙනවා. මෙලොව පරලොව දෙකටම අයිති කෙනෙක් පනවන්නත් බැහැ. දුකේ අවසානය යි ඒ. මේ පුද්ගලභාවයේ නො ඉපදීම නිසා.

ඔච්චර ගැඹුරක් ඕන නැහැ. මේ කාරණා ටිකෙන් මම මතක් කළේ ලෝකයා දකිනවාට වඩා තීක්ෂණ නුවණක් ඇතිකර ගන්න ජාතිය කියලා කිව්වේ මොකක්ද කියන එක. ඒ පමණකින් ම චතුරාර්ය සත්‍යය දකිනවා එයා. චතුරාර්ය සත්‍යය දන්නවා කියලා කියන්නේ ශ්‍රැතවත් ආර්ය ශ්‍රාවකයා, ඉපදුණොත් ජරා මරණ දුක ම යි කියලා දුක්ඛ සත්‍යය දන්නවා. දුකට හේතුව කියන කොට ඉපදෙන්න තියෙන හේතු ටික, තණ්හා-උපාදන-භව කියන මෙන්න මේ ටිකයි - භව කියලා කිව්වේ, පෙර අවිද්‍යා සංඛාරයෙන් හටගත්ත මේ ස්පර්ශ ආයතන හය. ඒකේ ඇත්ත නො දන්නා කම නිසා හටගත්තු තණ්හා-උපාදන කියන කෙලෙස් ටික ආපහු ඒ මත ම තබන එක තමයි පුද්ගලයෙක් නිර්මාණය වෙන්න හේතුව කියලාත් දන්නවා. තණ්හා-උපාදන භවයට ප්‍රත්‍යය නො වුණොත්, තණ්හාව නිරුද්ධ වුණොත් දුක නැති වෙනවා කියලා කිව්වේ, තණ්හා-උපාදනය නැතිවුණොත් ආපහු අර සතරමහාධාතුව නැත්නම් නාමරූප දෙක පැත්තට නො ගියොත් ඉපදෙන්නේ නැහැ. දුක නැහැ. **සම්මා දිට්ඨි.**

ඒ නිසා එයා දුකත් දන්නවා. දුක ඇතිවෙච්චි හැටිත් දන්නවා. දුකේ නිරෝධය නිවනත් දන්නවා. නිවන එයා දකිනවා. ඉපදීම නැති කළොත් ජරා-මරණ නැතිවෙනවා ම යි කියලාත් දකිනවා. ඉපදීම නැතිවෙන හැටිත් දකිනවා. රූපය පිරිසිඳ දැකලා කෙලෙස් ටික නැති කළොත් නො ඉපදෙන්න පුළුවන් කියලාත් දකිනවා. ඒ නිසා අප්‍රමාදීව ප්‍රතිපදාව පුරනවා. මොකට ද? කාමභූමියේ නම් රූපය පිරිසිඳ දකින්න වෙහෙසෙනවා, හිතේ තියෙන ගති ටික, ආශ්‍රව ධර්ම ගෙවාගන්න.

රූප-අරූප භවයේ නම් නාම ධර්ම ටික පිරිසිඳ දකිනවා හිතේ තියෙන ආශ්‍රව ගෙවාගන්න. ගෙවුණහම, ආශ්‍රවක්ෂය වුණහම, මේ කෙලෙස් ටික ස්කන්ධ මත පතිත වෙලා ඉපදීම වෙන්නේ නෑ කියන නුවණ තියෙනවා. කෙළවරට ගියහම, සියලුම ආශ්‍රවක්ෂය වුණහම දන්නවා දැන් මොකක් ද? ඉපදීම ඉවරයි. කාගෙද? තමන්ගේ, අනිත් අයගේ. කාම ලෝකයේ සියලුම දෙයින්,

ඉපදීමෙන් මිදිලා. රූප ලෝකයේ ඉපදීමෙන් මිදිලා. අරූප ලෝකයේ ඉපදීමෙන් මිදිලා. තුන් භවයේ ම ඉපදීම නැතිකරලා.

ඒක යි ***ඛීණා ජාති.*** රහත් වුණා කියලා ඵල ප්‍රත්‍යවෙක්ෂා ඥානයට කියන්න තියෙන්නේ මොකක්ද? ඉපදීම නැති කළා. ඉපදීම නැති කළා කියන එකෙන් කියනවා මොකක් ද? අජරාමර වුණා කියන එක කියනවා. මම නිවුනා කියන එක කියනවා. ඉපදීම නැති කළා.

ඒ වාගේ ම ***වුසිතං බ්‍රහ්මචරියං.*** යමක් සඳහා භාවනා කළා නම් දැන් ඒක කරලා ඉවරයි. හැමදම කරන්න ඕන නැහැ. රූපය පිරිසිඳ දකින්න නම් වෙහෙසුනේ මොකට ද? කාම භූමියේ ඉපදීම නැති කරන්න යි. රූපය පිරිසිඳ දැකලා ඉවරවෙන කොට කාම භූමියේ ඉපදීම ඉවරයි. නාම ධර්ම ටික පිරිසිඳ දැක්කේ මොකට ද? රූප අරූප භවයේ ඉපදීම නැතිකරන්න යි. නාම ධර්ම ටික පිරිසිඳ දැකලා ඉවරවෙන කොට රූප අරූපභවයේ ඉපදීම නැති කරලා ඉවරයි. නාම රූප දෙක පිරිසිඳ දකින කොට තුන් භූමියේ ඉපදීම නැතිකරලා ඉවරයි. එතකොට දැන් ඉපදීම නැති කළා. නැතිවුණා. එයා මනුෂ්‍යයෙකුත් නෙවෙයි. දෙවියෙකුත් නෙවෙයි. බ්‍රහ්මයෙකුත් නෙවෙයි. ඒ කවුරුවත් යන ගණයට යන්නේ නැහැ. යමක් සඳහා මේ බ්‍රහ්මචරියාව පිරුවා නම් දැන් ඒක පුරලා ඉවර යි. ***නා පරං ඉත්ථත්තායාති.*** මත්තේ කරන්න දෙයක් නැහැ. කටයුත්ත කළා කියන ප්‍රත්‍යවෙක්ෂා ඥානය උපදිනවා.

එතැනට යි බුදුරජාණන්වහන්සේ ධර්ම දේශනා කළේ. දුක පිරිසිඳ දකිනවා නම් සමුදය දන්නවා ම යි එයා. සමුදය දන්නවා නම් නිරෝධය දන්නවා ම යි කියලා කියන්නේ, මේ ඉපදීම කියන කාරණාව දුකක් ම යි කියන කොට එයා දන්නවා දුක පිරිසිඳ දකින්න නම් ඉපදෙන්නේ මෙහෙම යි කියලා යි සූත්‍රයේ තියෙන්නේ. කෙලෙස් ටික ස්කන්ධයන් මත තබලා ඉපදුණොත් ඉපදීම දුක ම නේ කියන කොට සමුදය අහුවෙලා ම යි. එතකොට ඉබේම කියනවා කෙලෙස් ටික ස්කන්ධ මත තැබුවේ නැත්නම් උපදින්නේ නැහැ. දුක නිරුද්ධ වෙනවා නේ කියන පණිවිඩය තියෙනවා ඒ දර්ශණයේ. දෙපැත්තක වර්ණ වගේ තමයි. එතකොට

ප්‍රතිපදාව වෙනවා එහෙනම් මම මේ ස්කන්ධ ටික පිරිසිඳ දකලා කෙලෙස් නැති කරන්න ඕනේ කියලා.

ඔය දර්ශණය ගැන නිසැක වෙන්න. ඔය දර්ශණය දැනගෙන ඉවර වෙලා දැන් ප්‍රතිපදාවට, සම සතලිස් කමටහන් වලින් ඕනෑම කමටහණක් උදව්කරගන්න. නාම ධර්ම, රූප ධර්ම විදර්ශණා කරන ඕනෑම ක්‍රමයකට විදර්ශණා කරන්න. ඒ මොන දෙයක් කෙරුවත් එයා දීඝී වශයෙන් කළත්, කෙටියෙන් කළත්, සතරසතිපට්ඨානය කළත්, කුමන ස්කන්ධයක් වැඩුවත්, ආශ්‍රවක්ෂය වෙනවා. මේක කරන්නේ ඇයි කියන නුවණ දන්නවා නම්, නිවන දකින නිසා, දැකපු නිසා.

දැක්ක නිවනක් උදෙසායි එයා මේ යන්නේ. නො දැක්ක දෙයක් අරබයා නෙවෙයි. ඉපදීම නැති කළොත් අජරාමර වෙනවා ම යි කියලා දැක්කා. ඉපදීම ඇතිවෙච්චි හැටිත් දැක්කා. ඉපදීම නැතිවෙන ක්‍රමය ගැනත් සැක නෑ එයාට. මෙහෙම කළොත් නූපදින්න පුළුවන් කියලා. ඒ හින්දු නො ඉපදීම දැක දැක යි මේ ප්‍රතිපදාව පුරන්නේ. ඒකාන්තයෙන් ම එයාට පුළුවන් වෙයි මේ බ්‍රහ්මචරියාව අවසන් කළා කියලා ප්‍රකාශ කරන්න යම් දවසක.

එහෙම නැතුව අද දවසේ දී අපි කරන වැඩේ තමයි මම අර මතක් කළේ, බුදුරජාණන්වහන්සේ දේශනා කරන්නේ, ඉනිමඟක් බඳිනවා. ඉනිමඟ බඳින පුද්ගලයා ගාවට ගිහිල්ලා අහනවා 'උඹ මොක ද කරන්නේ?' 'ඉනිමඟක් බඳිනවා.' 'මොකට ද ඉනිමඟ බඳින්නේ?' 'ගොඩනැගිල්ලට නගින්නයි.' 'කොහෙද ඔය ගොඩනැගිල්ල තියෙන්නේ?' 'දන්නේ නැහැ.' 'කොච්චරක් ඒ ගොඩනැගිල්ල උස ද?' 'දන්නේ නෑ.'

ඉනිමඟක් බඳිනවා. බඳින ඉනිමඟින් නගින්න යන ගොඩනැගිල්ල කොහෙද තියෙන්නේ කියලා දන්නෙත් නැහැ. ඒක කොච්චර උස ද කියලා දන්නෙත් නැහැ. 'මහණෙනි මේ පුද්ගලයාගේ ක්‍රියාව හිස් එකක් නෙවෙයි ද' කියලා අහනවා.

ඒ වගේ නිවන් දකින්න ප්‍රතිපදාවක් නම් අපි ඔක්කොමලා ම පුරනවා. මොකක් ද නිවන? දන්නේ නැහැ. කොහෙ ද තියෙනනේ? දන්නේ නැහැ. ඒක දැක්ක ද? නෑ. දන්නෙත් නෑ. දැක්කෙත් නෑ. කොහෙද තියෙන්නේ කියලා දන්නෙත් නෑ. හැබැයි ප්‍රතිපදාවක් නම් පුරනවා. නිවන් දකියි කියලා. මෙහෙම යන කොට නිවන් දැක්ක හැකි යි කියලා.

අර පුරුෂයාගේ ඉනිමං බැඳිල්ල යි, අපේ නිවනට මග වැඩිල්ල යි සමාන යි. නමුත් නිවන් දකිනවා කියන්නේ මෙන්න මේක යි කියලා ඉස්සෙල්ලා නිවන අනුමානයට හරි එයා දැකලා තියෙන්න ඕන. කල්‍යාන මිත්‍ර ඇසුරෙන්, සද්ධර්ම ශ්‍රවණයෙන් කරන්නේ නිවන පෙන්නන එක යි. නුවණක් තියෙන කෙනා නිවන කියන්නෙ මෙන්න මේක නේ ද කියලා ජාති නිරෝධය දකිනවා. ඊට පස්සේ තමයි එයා දැක්ක නිවන අරහයා, දුටු ධර්මය අරහයා, පරප්‍රත්‍ය රහිතයි කියලා කියන්නේ දුක නිවෙන තැන එයා දැක්කා. ඒ සඳහා එයා මග වඩනවා. එයා කවදා හරි දවසක ඒ කාරණාව සාක්ෂාත් කරගන්න ඉලක්කයක් තියෙයි. මෙන්න මෙතැනටයි යන්නේ කියලා.

ඒකට කාම භූමියේ සතරමහාධාතු රූපය විතරයි බලන්නේ. වැඩ කටයුතු කරද්දී, උයද්දි පිහද්දී නිකමට මේ හැම දෙයක් ම, සවිඤ්ඤාණක අවිඤ්ඤාණක සියලු දේම අවකාශ ධාතුව තුළ සතරමහාධාතුව රාශි වෙලා තියෙන හැඩ නේද කියලා හිත හිතා බල බලා හිටියත්, ආශ්‍රවක්ෂය වෙනවා. එහෙම බල බලා ඉන්නේ ඇයි කියන නුවණ එයාට දැන් තියෙනවා. එහෙම බල බලා ඉන්න බැරිවෙන හැම වෙලාවක ම කම්සය, කොස්ස, ඉදල, මුට්ටිය, හට්ටිය කියන ගති ඒ මත පතිත වෙලා මේ ද්‍රව්‍ය නිර්මාණය කරනවා. ඊට පස්සේ ඒ ද්‍රව්‍ය එක්ක තමයි හිත හිතා මනස ගනුදෙනු කරන්නේ. ලෝකය. සතරමහාධාතුවල හැඩ එක්ක තමන්ගේ ඇතිවෙන මිම් ඇත්තවෙලා ඊට පස්සේ තමන් ඒ එක්ක යි ගනුදෙනු කරන්නේ. කෙලෙස් ටික වෙනම පැත්තක. සතරමහාධාතුව වෙනම පැත්තක. මේ දෙන්නා පතිත වෙලා නිර්මාණය කරපු දේ ඊට පස්සේ ඇත්ත යි එයාට. එයා මුට්ටිය

ගැන, මුට්ටියේ බත් උයන හැටි, හාල් කොච්චරක් දන්න පුළුවන් ද, වතුර කොච්චරක් දනවාද කියන එක තමයි එයාගේ ප්‍රශ්නය ඊට පස්සේ. ඒක ඇත්තම වෙලා. දැන් ලෝකය ඇත්තම වාගෙ යි.

ඊ ගාවට ඔච්චර ඇත්ත වෙච්චි ලෝකය හරිම පුදුම විදියට යි අනිත් පැත්තට යන්නේ. හිතාගන්න ම බැරි වෙයි. මේ ලෝකය ම බොරුවක් වෙලා. ***ස්වප්නූපමා කාමා.*** ඔය ඇත්තන්ට හීන පෙනෙනවා නේ. ගෙවල්දොරවල්, ඉඩකඩම්, මිනිසුන්, සත්තුයින්, කෑමබීම පෙනෙනවා නේ. ඇයි ඒකට හීන කියන්නේ? අල්ලන්න බැහැ. පරිහරණය කරන්න බැරි නිසා යි. මේ පෙනෙන දේවල් ඔය ඇත්තන් දන්නවා ද අල්ලන්න බැරි, පරිහරණය කරන්න බැරි වුණොත් මේ ඔක්කෝ ම හීනවෙනවා නේද ඔය ඇත්තන්ට කියලා. මේ පෙනෙන දේ මට අල්ලන්න බැරි නම් මට හීනයක් වෙනවා. දැන් වෙලා තියෙන්නේ අල්ලන්න පුළුවන් හින්දයි ඔය ඇත්ත. ඒ කියන්නේ පොට්ඨබ්බ ධාතුවට, සතරමහාධාතුවට සාපේක්ෂව යි මට කාමලෝකය ඇත්ත වෙලා තියෙන්නේ. ඔය ක්‍රමය කරගෙන යන්න කියලා කියන්නේ, පෙනෙන, ඇහෙන, දැනෙන හැම දේ ම සතරමහාධාතුව වෙන් කරනවා ඔය ඇත්තන්. අල්ලන්න බැහැ. ඇල්ලුවොත් අහුවෙන්නේ පඨවිධාතුව යි. අහුවෙන්නේ ආපෝ ධාතුව යි. දරුවා කියලා සිහි කළ හැකි යි. අල්ලන්න ගිහින් හදනවා. බෑ. එතන සතරමහාධාතුවයි කියලා පෙන්නනවා. මුට්ටිය. සිහි කළ හැකියි. අල්ලන්න ගියොත් පඨවි ධාතුව යි. සිහි කරන, සිහි කරන එකේ ධාතුව පෙන්නන කොට අල්ලන්න බැහැ. පරිභෝජනය කරන්න බැහැ කාමවස්තු. දරුවා-ගෙදර-රන්-රිදී-මුතු-මැණික් කියලා සිහි කළ හැකියි. මනසෙන් කාමය. නමුත් කාමය පරිභෝජනයට යන්න දෙන්නේ නැහැ. පරිහරණය කරන්න දෙන්නේ නැහැ. නුවණින් ගිහිල්ලා පෙන්නනවා. අල්ලන්න බැහැ. අල්ලන්නේ පඨවි ධාතුව යි. අහුවෙන ධාතුව පෙන්නන කොට, පෙන්නන කොට වෙන්නේ මොකක් ද? පෙනුනාට අල්ලන්න බැරි වුණොත් හීනයක් වෙනවා. ***ස්වප්නූපමා කාමා.*** කාමය හීනයක් කියන තැනට ආපු දවසටයි කාමයෙන් මිදෙන්නේ. එදාට ***විවිච්චෙව කාමෙහි*** - කාමයන්ගෙන් වෙන් වෙලා, ***විවිච්චෙව අකුසලෙහි*** - කාමච්ඡන්ද ව්‍යාපාද කියන පංච නීවරණ, අකුසල ධර්මයන්ගෙනුත්

වෙන් වීම නිසා, අධික ප්‍රීතියක්, සැපයක් දැනෙනවා. ඒ ප්‍රීතියට යි, සැපයට යි හිත එකඟ වෙනවා. ඒ එකඟවෙන සමාධියට කියනවා ***විවිච්චෙව කාමෙහි, විවිච්චෙව අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමං ඣානං*** කියලා.

එදට ඔය ඇත්තන්ට කාම ලෝක නෑදෑයින් නැහැ. හැබැයි බ්‍රහ්ම ලෝක මට්ටමේ නෑදෑයින් ඉන්නවා. ඒ කියන්නේ සතරමහාධාතුව පිළිගන්නේ නැහැ. අම්මා ඉන්නවා, තාත්තා ඉන්නවා, දුව පුතා ඉන්නවා කියලා. මේ සතහමහාධාතුවේ දුක් විඳන නෑදෑකම් තියෙන්නේ ඔය ඇත්තන්ගේ හිතේ කෙලෙස් ටික මත යි. ඇත්තට ම සතරමහාධාතුවේ තියෙනවා නෙවෙයි. ඒ කෙලෙස් ටික මිදුනහම හිතේ නාමධර්ම ටිකේ නෑදෑකම් ඇතිවේවි. ඒ වාගේ ම ආරම්මණ පඨවි ආපෝ තේජෝ වායෝ, අරමුණක් ඇතිකරගන්න උදව්වෙන පඨවි-ආපෝ-තේජෝ-වායෝ කියන මට්ටමේ ලෝකය මැවෙයි. ඒකට කියනවා **රූප භව** කියලා. එතැනත් රූපයක් තියෙයි. හැබැයි මනෝමයෙන්. ඒකත් මේ වාගේ ම මෙනෙහි කරන්න.

අදාළ ටික මතක් කළේ, ඕනේ වුණේ මට ගොඩාක් නෙවෙයි. නිවන කියන එක දකින්න පුළුවන් එකක් කියන එක පෙන්නන්න යි. නිවන් දැකලා ම නිවන් දකින ප්‍රතිපදාව වඩන්න කියන පණිවිඩය යි මට කියන්න ඕනෑ වුණේ. නිවන පෙන්නන්න කෙනෙක් හොඳ ඉන්ද්‍රිය ශක්තිය තියෙන නුවණ තියෙන මනුෂ්‍යයින් වෙලා අපි ඉන්න ඇති. ඒත් නිවන පෙන්නන්න කෙනෙක් අපට හම්බවුණේ නැති හින්ද අනන්ත ජාති සසර වැරදුනා. නිවන පෙන්නන බොහෝ සත්පුරුෂයින් ලෝකයේ උපන්නා. අනේ ඒ කාලයේ අපට මනුෂ්‍යයෙක් වෙන්න බැරිවෙච්චි නිසා, ධර්මය තේරුම්ගන්න බැරිවෙච්චි නිසා නිවන බලාගන්න බැරිවුණා. අපි පෙරේත ලෝකයේ හිටියා, අසුර ලෝකයේ හිටියා, නිරය ලෝකයේ හිටියා, අසඤ්ඤතලවල හිටියා. සමහර විට සත්පුරුෂ උත්තමයෝ ලෝකයේ පහළවෙලා නිවන පෙන්නුවා. අනේ අපට ඒක බලාගන්න තරම්වත් ඔළුවක් නැහැ - මන්දබුද්ධික යි. කන ඇහෙන්නේ නැහැ. ඇස් පෙනෙන්නේ නැහැ. ඒ වගේ ඉන්ද්‍රිය

ආබාධ සහිත යි. ඒත් නිවන වැරදුනා. ඕකට කියනවා අෂ්ඨදුෂ්ඨක්‍ෂණ කියලා. ක්‍ෂණ සම්පත්තියෙන් කල්‍යාන මිත්‍ර ඇසුරෙන් නිවන පෙන්නන අයත් ලෝකයේ ඉන්නවා. අපිත් ඉන්ද්‍රිය විකෘති නොවී, මනුෂ්‍යයින් වෙලා, පෙන්නන නිවන බලන්න ඇහැකුත් තියෙයි, දකින්න පුළුවන්කමකුත් තියෙ යි. එබඳු හැකියාව ඇතිව පෙන්නන දේ දකිනවා. අන්න එයා ක්‍ෂණ සම්පත්තියෙන් වැඩක් ගත්තා වෙනවා.

ඒ නිසා නිවන පෙන්නන්නත් කට්ටිය ඉන්න ඕන. නිවන බලන්න පුළුවන්කම තියෙන්නත් ඕන. දෙපැත්ත ම වැරදුණොත් වරදිනවා.

ඉතින් මම මේ සාසනයට පුළුවන් තරම් සාධාරණයක් කරනවා. මම මතක් කළා මෙතැනට එන්න මගේ ජීවිතයේ හුඟක් දුක් පීඩා සහිතයි. හැබැයි මම දුක්වෙන්නේ නැහැ. මම කාටවත් ලෝකයට බණ කියන්න මේ ගමන් මග ආරම්භ කළේ නැහැ. සසර දුකයි, දුකෙන් එතෙර වෙන්න මග හොයාගන්නවා කියන තැනකින්, නිවන් දකිනවා, සසරෙන් එතෙර වෙනවා කියන සත්පුරුෂ අදහසින් ම යි පැවිදි වුණේ. මම එදා ඉඳන්ම ඒ සඳහා ම උත්සාහවත් වුණා. උත්සාහවත් වෙලා වෙලා වෙලා, කලින් කලට, කලින් කලට තිබුණු මේ දර්ශණයේ ගැඹුරු ගැඹුරු ගැඹුරු ගැඹුරු වී ආවා.

මම මතක් කරනවා, මෙතැනින් එහාට මගේ දේශනා ගැඹුරු වෙන්නේ නැහැ. මේ දර්ශණයෙන් මම සෑහීමකට පත්වෙනවා. යම් කිසි කෙනෙකුට මේක නිවන නෙවෙයි නම්, මේක තේරෙන්නේ නැතිනම් මම හැමෝට ම මතක් කරන දෙයක් තමයි, තව දුරටත් මම එක්ක එන්න එපා. මෙයින් තොර, වෙන දේශකයින් වහන්සේලා හෝ වෙන දේශනා අනුගමනය කරමින් ධර්මය හෙව්වාට කමක් නෑ කියන එකත් මතක් කරනවා. මේ මගේ නිවන් මග සෙවීමේ අවසානයට ඇවිල්ලා. ආයෙ මට මාර්ගයක් සොයන්න නෑ. තියෙන්නේ මාර්ගයක් වඩනවා නම් වඩන්න මිසක, මට ආයෙ හොයන්න මගක් ඉතුරුවෙලා නෑ. මේ දර්ශණයෙන් මම සෑහීමකට පත්වෙනවා. තව කෙනෙක් ඒක පිළිගන්නේ නෑ, තේරෙන්නේ නෑ

කියලා එයා වෙනුවෙන් හොයන්න මම යන්නේ නෑ. මම ආවෙත් නැහැ තව කෙනෙක් වෙනුවෙන් හොයන්න. මේ බණ අහන පිරිස වෙන්න පුළුවන්. ලෝකය වෙන්න පුළුවන්. ඕකට වඩා නිවන වෙන එකක් වෙන්න ඇති, වෙන විදියක් ඇති කියලා කාට හෝ ප්‍රශ්න තියේ නම් ඒවාට විසඳුම් හොයාගන්න. ඒවාට විසඳුම් මගෙන් බලාපොරොත්තු වෙන්න එපා. මම ආවේ මට සසරෙන් එතෙර වෙන්න යි. මේ දර්ශණයෙන් මම සෑහීමකට පත්වෙනවා. මගේ දුක නිවෙනවා කියලා මට පෙනෙනවා. ඒ නිසා මම සතුටු වෙනවා. මම නතර වෙනවා.

මේක තේරෙන්නේ නැති කෙනෙක් ඉන්නවා නම්, හැමෝට ම මම මගේ අනිත් දේශනා වලත් මතක් කරලා තියෙනවා, මින් පස්සේ මගේ බණ අහන්න එපා. මම එක්ක එන්න එපා. මාව අනුකරණය කරන්න එපා. තව දුරටත් ගැඹුරෙන් හාමුදුරුවෝ අපට කියලා දෙයි නේ කියන අදහසකුත් හිතන්න එපා.

නමුත් මෙයිට වඩා මේ දුක පිරිසිඳ දකින්න පෙන්නන ක්‍රම අලුත් වෙයි, දියුණු වෙයි. සමුදය පෙන්නන හැටි, නිරෝධය පෙන්නන ක්‍රම දියුණු වෙයි. ඒ දකපු මේ නිවන ම පිරිසිදු වෙනවා මිසක වෙන මීට ඔබ්බක් නම් නෙවෙයි කියන එකත් මතක් කරමින් අද මගේ දේශනාව අවසන් කරනවා.

හැම දෙනාට ම තෙරුවන් සරණ යි.

මේක එක පාරට ම බැරි නම් අතහරින්න එපා. තේරුම්ගන්න උත්සාහවත් වෙන්න. හැමදම අපේ හදවත් තුළ ඇවිලුණු ගින්නක් යුතුකම්, වගකීම්, නෑදෑකම් අබියස දී මුලු ජීවිතයට ම බණක් අහන්න, විවේකයක් ගන්න මොකුත් නිදහසක් නෑ අද කාටවත්. කෙළවරක් නැති ලෝකයකට බැඳිලා, වගකීම් රාශියක් ඇත්ත වෙලා, මුලු ජීවිතයම අපි දියකරනවා අපේ යුතුකම්, වගකීම් වෙනුවෙන්. අපි ඔක්කෝ ම සැප විඳින්න උත්සාවත් වෙන අය යි. සැප විඳින අය නෙවෙයි කවුරුවත්. ගෙවල් හදනවා, දරුවන් හදනවා, ඉඩකඩම් ගන්නවා, යාන වාහන ගන්නවා. මේවා එකතු කරන්නේ මොකට ද? සැප විඳින්න යි. සැප විඳින ද්‍රව්‍ය එකතු

කරලා, එකතු කරලා තියලා මැරිලා යනවා. දන්නෙත් නැහැ. ලෝකයා කරන්නේ ගෙවල් හදනවා. සැපසේ ඉන්න නේ. වාහන ගන්නවා. තවම එකතු කිරීමේ සීමාවක් තියෙනවා ද බලන්න කො සැප විඳින්න. විඳ විඳ ඉන්න බැහැ. තවම සැප විඳන්න කරුණු එකතු කරනවා. රූපවාහිණියක් ගන්නවා, ශීතකරණයක් ගන්නවා, ඉඩමක් ගන්නවා, ගෙයක් ගන්නවා. මේ සැප විඳින්න කරුණු එකතු කර කර ඉඳලා ම මැරිලා යනවා මිසක, සැප විඳන අය කවුද කියන්න මට.

අද නෙවෙයි, මුළු සසරේදීත් කළේ ඕකයි. මෝඩ වෙන්න එපා. බුද්ධිමත් වෙන්න. දුවන්නන් වාලේ දුවන සමාජ රටාවට එකතු වෙලා දුවන්නට එපා. අනාත්ම වූ රූපයකුත්, ඒ අරභයා ඇතිකරගත්ත සිතුවිලි ටිකකිනුත් නිර්මාණය වෙච්චි ලෝකයට කියනවා විඤ්ඤාණයේ මායාවක් කියලා. විඤ්ඤාණය නමැති මායාකාරයා විසින් දක්ෂ ලෙස මවන ලද මායාවක අපි ඔක්කෝම පැටලිලා යි ඉන්නේ. අම්ම-තාත්තා-දුව-පුතා-සහෝදරයෝ-සහෝදරියෝ කියලා ඇතිකරගත්ත වගකීම් වලින් මිදිලා යන්න බැරි, බේරිලා යන්න බැරි තරම් ඇත්ත ම වෙලා මේක අපට. එයිටත් එහා බැම්මක් තිබුණත් ඒ බැමිත් ලිහිල් වෙනවා සම්මාදිට්ඨියට. ඊටත් එහා ලෝකය ඇත්ත වෙච්චි කමක් තිබුණත්, ඒ බැමිත් ලිහිල් වෙනවා මේ චතුරාර්‍ය සත්‍යය දන්නා නුවණට. ඒ නුවණ ඊට වඩා බලවත්. ඒ නිසා මේ නුවණ අතහරින්න එපා.

ඊ ගාවට ඔය ඇත්තන්නට හිතෙයි මේ සතරමහාධාතු බල බලා ඉන්න කොට ගෙවල්-දොරවල්-දූ දරුවෝ-නෑදෑයෝ මේවා මොකුත් නැති වෙයි නේ අපට කියලා වගේ හිතෙයි නම්, ඒ තමන්ව අතහැරලා බලන හින්ද යි. තමන්වත් එක්ක බැලුවත් ඔය ඇත්තන් හිතන්න එපා කාමය අතහැරුණා කියලා දුකකට පත්වෙනවා කියලා.

මනුෂ්‍ය ලෝකයේ ඉන්න චක්‍රවර්ති රජ්ජුරුවෝ කියලා කියන්නේ මුළු ලෝකයට ම අධිපති එක රජ්ජුරුවෝ යි. මේ චක්‍රවර්ති රජ්ජුරුවෝ හිඟන්නෙක් යන ගනයට යනවා කියනවා

චාතුර්මහාරාජික දිව්‍ය ලෝකයේ අන්තිමට ම අඩු හිඟන දෙවියාට සාපේක්ෂව. හිඟන දෙවියා කියන්නේ අල්පේශාක්‍ය දෙවියාට සාපේක්ෂව චක්‍රවර්ති රජ්ජුරුවෝ කියන්නේ හිඟන්නෙක් යන ගනයට යනවා. රජ බොජුන් වළඳන රජ කෙනෙකුට හිඟන්නෙක්ගෙන් හිඟා කාලා අතට අරගත්ත බත් ටිකක් දැකලා තණ්හාව හිතේවි ද? නෑ. හිඟන්නාට නම් තණ්හාව හිතෙයි රාජ භෝජන දිහා බලලා නේ ද? ඒ වගේ චාතුර්මහාරාජිකයේ ඉන්න කෙනාට කවදාවත් මනුෂ්‍ය ලෝකයේ තණ්හාවක් නම් නැහැ. මනුෂ්‍යයන්ට නම් ඒකේ තණ්හාව එයි. ඒ නිසා කාමය අහැරියොත් දුකට පත්වෙයි කියලා හිතන්න එපා.

චාතුර්මහාරාජිකයේ ඉන්න ඉහළ ම ම දෙවියා, ආශ්චර්යවත් ම දෙවියා තව්තිසාවේ ඉන්න හිඟන ම මට්ටමේ දෙවියාට සාපේක්ෂව හිඟනකමට යනවා.

ඊට පස්සේ තව්තිසාවේ ඉන්න ඉහළ ම ආශ්චර්යවත් දෙවියා යාමයේ ඉන්න පහත් ම, අල්පේශාක්‍ය ම දෙවියාට සාපේක්ෂව හිඟන ගනයට යනවා. ඔහොම, ඔහොම, ඔහොම, ඔහොම ගිහිල්ලා කාම ලෝකයේ ඉන්න ඔක්කෝම රූපී බ්‍රහ්මලෝකයේ බ්‍රහ්ම පාරිසජ්ජය කියන අන්තිම පහත් බ්‍රහ්ම පාරිසජ්ජයේ දෙවියන්ට සාපේක්ෂව හිඟන ගනයට යනවා.

ඔහොම ගිහිල්ලා, ගිහිල්ලා, ගිහිල්ලා, ගිහිල්ලා රූප භවයේ ඉන්න ඉහළ ම කෙනා අරූප භවයේ ඉන්න කෙනාට සාපේක්ෂව හිඟන ගනයට යනවා. නිවන් දැකපු රහතන්වහන්සේට සාපේක්ෂව තුන් භූමිය ම හිඟන්නෙක් යන ගනයට යනවා. නිවන කියන එක එච්චර සැපක්.

අජරාමර නිවන, ජාතියක් නැති, ජරාවක් නැති, ව්‍යාධියක් මරණයක් සෝක පරිදේව දුක්ඛ දෝමනස්සයක් නැති බුදු පසේබුදු මහරහතන්වහන්සේලා නිවී සැනසී පැමිණ වැඩ වදාළා වූ නිවන කියන වචන ටිකකින් හඳුන්වන්නෙත් මේ පුද්ගලභාවයේ නිවීම ලෙහෙසි නිවීමක් නෙවෙයි. ඒ නිවීම කියන එකට, ඒ සැපයට දෙවියනුත් ඊෂ්‍යා කරනවා. ඒ විඳන සැපයට. ***නිබ්බානං පරමං***

*වදන්ති බුද්ධා* - නිවන උතුම් ම සැපයක් කියලා බුදුරජාණන්වහන්සේලා දේශනා කරනවා.

ඉතින් ඒ නිසා හැමදෙනාට ම මතක් කරනවා මේ උතුම් බුද්ධොත්පාද කාලයේ, මනුෂ්‍ය ජීවිතය ලැබුණු වෙලාවේ සද්ධර්මය තියෙන මේ වටපිටාවේ මේ ඉපදෙමින් මැරෙමින්, මැරෙමින් ඉපදෙමින් යන සංසාර ගමන නතර කරලා තමනුත් මිදිලා, අනේ මට අම්මා, තාත්තා, සහෝදරයා, සහෝදරී වෙච්ච මේ මනුෂ්‍යයන්ගේ සසර ගමන ගහලා බැනලා හරි මේ බණ ටික කියලා දුක නිවලා දෙන්න. ඒක තමයි සත්පුරුෂකම. ඔය ඇත්තන් අද මුළු ජීවිතය පුරාවට ම අම්මා තාත්තාව බිමවත් නොතියා කන්න බොන්න දුන්නොත්, උපස්ථාන කළොත්, සුඛෝපභෝගී යාන වාහන අරගෙන දුන්නා කියන්න. ඔය ඇත්තන්ට කිරි දුන් අම්මාට, ඔය ඇත්තන් පෝෂණය කළ පියාට ඔය ඇත්තන් යුතුකම් කළේ අවුරුදු පණහක් විතරයි. ඊගාව භවයේ උපන්නහම කවුද ඔය උපස්ථාන කරන්නේ? නමුත් ඔය ඇත්තන්ට පුළුවන් නම් මට අම්මා වෙච්චි, මට තාත්තා වෙච්චි, සහෝදර සහෝදරියන් ඥාති හිතෛශීන් වෙච්චි කෙනාට චතුරාර්‍ය සත්‍යය අවබෝධ කරවන්න, ඉපදීම දුකක් කියලා පෙන්නලා, නූපදීම සැපක් බව අවබෝධ කරවන්න, ඒකට යන මාවත පෙන්නන්න පුළුවන් නම් ඔබ ඒ ජීවිතයට පිහිට වුණා. සැබෑම ආදරය එයයි. අනන්ත සංසාරයකට පිහිට වුණා වෙනවා.

ඉතින් හැම දෙනාට ම ඒ සත්පුරුෂ ගතිය පිහිටාවා! ඔබ නිසා බොහෝ දෙනෙක් සසරින් එතෙර වේවා කියන අදහසින් මේ දේශනාව අවසන් කරනවා. හැම දෙනාට ම නිර්වාන සම්පත්තිය ම අවබෝධ වේවා!

අජරාමර වෙන්න නම් නූපදින්න වෙනවා. ***ජාති නිරොධො ජරාමරණං සොක පරිදෙව දුක්ඛ දෙමනස්ස උපායාසා නිරුජ්ඣන්ති.*** ජරාමරණ සෝක පරිදේවයන්ගෙන් මිදෙන්න නම්, ඒවා නිරුද්ධ වෙන්න නම්, නිරුද්ධ වෙන්න වෙනවා ජාතිය, නැත්නම් ඉපදීම. ඉපදීම නැතිකරලා අජරාමර වෙන එකටයි, නිවන කියලා කියන්නේ.

මෙතන තියන සුවිශේෂිකම මේ ශාසනයේ '***පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි, ඤාණං උදපාදි, පඤ්ඤා උදපාදි, විජ්ජා උදපාදි, ආලොකො උදපාදි*** බුදුරජාණන්වහන්සේට මේ දුකයි කියලා පෙර නො ඇසූ විරූ ධර්මයක් කෙරෙහි නුවණ පහළ වුණා. එතකොට මේ ජාති නිරෝධය පිළිබඳව ලෝකයේ කවදාවත් කිසිම කෙනෙක්ගෙන් අහලා නැති පණිවිඩයක් තමයි බුදුරජාණන්වහන්සේට අවබෝධ වුණේ, අවබෝධ කරගත්තේ. ඒකයි මේ චතුරාර්‍ය්‍ය සත්‍යය, නැත්නම් මේ නිවන මේ ශාසනයේ ම විතරයි තියෙන්නේ කියලා කියන්නේ. ජාතිය නිරෝධ කරලා, ජරාමරණ නිරෝධ කරන පණිවිඩය තියෙන්නේ මේ බුද්ධ ශාසනයේ මිසක වෙන තැනක නොවේ. එතකොට මේ ජාතිය කියන එක, ඉපදීම කියන, එක බුදුරජාණන්වහන්සේ ඉතා සුවිශේෂී ක්‍රම උපායකින්, ගැඹුරු දර්ශනයකින් පෙන්නනවා. අපට අවශ්‍ය යම්තාක් අජාරාමර බවක් නම් ඒ අජරාමර බව ලැබෙන පණිවිඩය පෙන්නනවා. ඒ නිසා මෙන්න මේ ටික හොඳට අහගන්න ඕනේ.